විද්‍යුත් පුරවැසි වාර්තාපතේ (eCRC) සොයා ගැනීම්

# ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ දෙවන සමීක්ෂණය

## මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව

2018 ඔක්තෝම්බර්



බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මේහලා මහිල්රාජා,
කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්

centre for poverty analysis

## විද්‍යුත් පුරවැසි වාර්තාපත් (eCRC) සමීක්ෂණයේ සොයා ගැනීම්

# ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ දෙවන සමීක්ෂණය

## මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව

2018 ඔක්තෝම්බර්

**බාසිත් අයිනදීන්, ඉසුරු තෙන්නකෝන්, මේහලා මහිල්රාජා, කේ. රොමේෂන් සහ හසන්ති තෙන්නකෝන්**

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2018

පළමු වන මුද්‍රණය - 2018

ISBN: 978-955-3628-34-3

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ විද්‍යුත් පුරවැසි වාර්තාපත් (e-CRC) සමීක්ෂණයේ සොයා ගැනීම් : මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ අවසන් වාර්තාව /

බාසිත් අයිනදීන් ...[සහ තවත් අය]. –

කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2018
පි. 43 ; සෙමී. 29

ISBN 978-955-3628-34-3

i. 373.07205493 ඩිව් 23 ii බාසිත් අයිනදීන් (සම කර්තෘ)

1. අධ්‍යාපනය, ද්විතීය – ශ්‍රී ලංකාව - පර්යේෂණ

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සතුය. මෙම පොතේ යම් කොටසක් ප්‍රති නිෂ්පාදනය කරන්නේ නම් ඊට පෙර කතුවරයාගෙන් සහ ප්‍රකාශකයාගෙන් නිසි අවසරය ලබා ගත යුතු වේ.

CEPA ආයතනයේ වර්තමාන ප්‍රකාශන මාලාව සමන්විත වන්නේ මෙම ලියවිලි වලිනි: අධ්‍යයන, සංස්කරණය කරන ලද වෙළුම්, කාර්ය පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා. මෙම අධ්‍යයනයේ ඇතුළත් සොයා ගැනීම් හා නිර්දේශ ඉදිරිපත් කරන ලද්දේ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රාජ්‍ය සේවා සම්පාදකයන් හා සේවාලාභීන් විසිනි. මෙම අධ්‍යයනය CEPA ආයතනයේ හෝ ආධාර දෙන ආයතනයේ අදහස් හෝ ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි.

මෙම ප්‍රකාශනය පිළිබඳ සියලු විමසීම් පහත සම්බන්ධතා වෙත යොමු කළ යුතුය:

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.

දුර : +94 (011) 46902200, 2676955 වෙබ් අඩවිය
විද්‍යුත් තැපැල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk

මෙම ප්‍රකාශනය සම්පාදනය කරන ලද්දේ යුරෝපා සංගමයේ සහාය ඇතිව ය. මෙම ප්‍රකාශනයේ අන්තර්ගතය සම්බන්ද වගකීම සම්පූර්ණයෙන් ම CEPA ආයතනය විසින් දරනු ලබන අතර යුරෝපා සංගමයේ ස්ථාවරය පිළිබිඹු කරන්නක් ලෙස කිසි සේත් ම සැලකිය නොහැකි ය.

# කතුවරු

## බාසිත් අයිනදීන්

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තේ ය. බාසිත් බහුපාර්ශ්වීය ක්‍රියාවලි හා සමාජ ඉගෙනුම් සම්බන්ධයෙන් නෙදර්ලන්තයේ වාහනින්ගන් විශ්වවිද්‍යාලයේ ද සමාජ වග වීමේ මෙවලම්, විශේෂයෙන් ම පුරවැසි වාර්තාපත් ක්‍රමවේදය සම්බන්ධයෙන් ඉන්දියාවේ බැංගලෝරයේ මහජන කටයුතු මධ්‍යස්ථානයේ ද ජාත්‍යන්තර බලපත්‍ර ලාභියෙකි. ක්‍රියාකාරකම් හා ව්‍යවහාරික පර්යේෂණ පිළිබඳ සිය විශේෂඥතාව දායක කරමින් CEPA ආයතනයේ දී බාසිත් නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින ඔහු සමාජ වග වීමේ යන්ත්‍රණයන් පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද ඔහු මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. මේ වන විට ඔහු CEPA ආයතනයේ පුරවැසි වාර්තා පත් යහපාලන මෙවලම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරමින් සිටී.

## ඉසුරු තෙන්නකෝන්

CEPA ආයතනයේ කනිෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙකු ලෙස කටයුතු කරයි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව, ආර්ථික ප්‍රතිපත්තිය හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති ඔහු මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයෙහි ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලොමා පාඨමාලාවක් හදාරමින් සිටී. උපදේශන මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු ද වන ඔහු, උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත. කවියෙකු වන ඉසුරු මේ වන විට කවි පොත් තුනක් පළ කර ඇත. මීට පෙර ඔහු ව්‍යාපෘති සම්බන්ධීකාරකවරයෙකු හා පර්යේෂණ සහායකයෙකු ලෙස ලාභ නොලබන සංවිධාන සමග කටයුතු කර ඇත. CEPA ආයතනයේ දී ඉසුරු කටයුතු කරන්නේ තේමාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයක් වන දරිද්‍රතාවේ පැතිකඩවල් සම්බන්ධයෙන් සහ සන්නිවේදන කණ්ඩායම සමග ය. මේ වන විට ඔහු පුරවැසි වාර්තාපත පිළිබඳව අවධානය යොමු කරන අධ්‍යයනයක නිරතව සිටින අතර මොණරාගල දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කාර්යය භාරව කටයුතු කරයි.

## මේහලා මහිල්රාජා

CEPA ආයතනයේ පර්යේෂණ වෘත්තිකයෙකි. ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන භාවිතය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඇය ශ්‍රී ලංකා ඇගයීම් සංගමයේ (SLEvA) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයෙහි (NILS) නිරීක්ෂණය හා ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර ඇත. CEPA ආයතනයේ දී මේහලා නිරතව සිටින්නේ හැකියා ගොඩ නැගීම, පුහුණුව සහ පර්යේෂණය යන ක්ෂේත්‍රවල ය. ඇය ක්‍රියාකාරකම් පර්යේෂණ සම්බන්ධයෙන් තමන් සතු විශේෂඥතාව පර්යේෂණ කටයුතුවලට එක් කරයි. මේ වන විට ප්‍රජා මූල මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමග කටයුතු කරමින් ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් සිටින මේහලා සමාජ වග වීමේ යන්ත්‍රණයන්, විශේෂයෙන් ම 'පුරවැසි වාර්තා පත්' මෙවලම, පිළිබඳ හැකියා ගොඩ නැගීම සඳහා සහාය දෙයි. ඇය වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්කවල ද්විතීය අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් CEPA ආයතනය විසින් 2014 දී සිදු කරන ලද පුරවැසි වාර්තා පත් සමීක්ෂණය හා ඊට අදාළව නිකුත් කරන ලද ප්‍රකාශනය සඳහා ද දායක වී ඇත.

## කුලසබානාදන් රොමේෂන්

CEPA ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙක් ද කළමණාකරන කණ්ඩායමේ සාමාජිකයෙක් ද වේ. පසු ගිය විසි වසර තුළ ඔහු රජය හා අරමුදල් සපයන සංවිධාන සමග එක්ව සංවර්ධන ක්ෂේත්‍රයෙහි කටයුතු කර ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. දරිද්‍රතාවේ පැතිකඩවල් වැඩසටහනේ කණ්ඩායම් නායකයෙකු වන රොමේෂ් සහ ඔහුගේ කණ්ඩායම CEPA ආයතනයේ පර්යේෂණ හා උපදේශන ක්‍රියාකාරකම් පදනම් කර ගෙන දරිද්‍රතාව, අසමානතාව හා සමෘද්ධිය පිළිබඳ පණිවුඩ සසඳා බැලීම

සම්බන්ධයෙන් වගකීම දරති. දරිද්‍රතාවේ පැතිකඩවල් කණ්ඩායම දරිද්‍රතාමානය පිළිබඳ කටයුතුවල ද නිරතව සිටින අතර දරිද්‍රතාවට සාර්ව සාධක කරන බලපෑම විමසා බැලීම සඳහා ද මුල පුරමින් සිටියි.

## හසන්ති තෙන්නකෝන්

ටැස්මේනියා විශ්වවිද්‍යාලයෙන් පාරිසරික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර සමායතනික ස්ථාවර භාවය සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ලබා ඇත. ඇයගේ අවධානය යොමු වන්නේ පාරිසරික තිරසර භාවය හා සමාජීය තිරසර භාවය යන ක්ෂේත්‍ර කෙරෙහි ය. මේ වන විට ඇය CEPA ආයතනයේ පර්යේෂණ උපදේශකවරයෙකු ලෙස මෙන් ම ලෝක බැංකුවේ සමාජ ආරක්ෂණ උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කරයි.

## දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යනු දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව දැනුම හා අවබෝධය පුළුල් කිරීමට කටයුතු කරන ස්වාධීන, ශ්‍රී ලාංකික බුද්ධිමතුන් කණ්ඩායමක එකතුවකි. දරිද්‍රතාව යනු වහා විසඳුම් සෙවිය යුතු සමාජ,ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අසාධාරණයන් සිදුවන්නක් බව අපගේ අවබෝධයයි. දරිද්‍රතාව සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීමට නම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති හා භාවිතයන් වෙනස් විය යුතු බව හා දරිද්‍රතාවෙන් පෙළෙන ජනයා සමග එක්ව වැඩ කළ යුතු බවට CEPA ආයතනය විශ්වාස කරයි. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් හා ව්‍යාපෘති වල දී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සඳහා දායක වීමට CEPA ආයතනය ප්‍රමුඛත්වය ලබා දේ. CEPA ආයතනය ලෙස අප අවධානය යොමු කරන්නේ ස්වාධීන විශ්ලේෂණ ඉදිරිපත් කිරීම, සංවර්ධන ක්‍රියාවලියට දායක වන්නන්ගේ හැකියාවන් වර්ධනය සහ ප්‍රතිපත්තිමය බලපෑම් කළ හැකි අවස්ථා සොයා බලා ඊට මැදිහත් වීම කෙරෙහිය. වඩා විශ්වසනීය අනුභූතික සාක්ෂි පදනම් කර ගෙන සමාජීය අවශ්‍යතාවයන් හඳුනාගෙන සේවාවන් සැපයීමට අප ආයතනය කටයුතු කරනු ලබයි. CEPA ආයතනය සේවාදායකයන්ගේ ඉල්ලීම් අනුව සුදුසු බුද්ධිමය හා තාක්ෂණික සේවාවන් ලබා දීම මෙන්ම පශ්චාත් ගැටුම් සංවර්ධනය, අවදානමට ලක් වීමට තිබෙන ඉඩකඩ, සංක්‍රමණය, යටිතල පහසුකම් හා පරිසරය වැනි පුළුල් තේමාත්මක ක්ෂේත්‍ර පහක් පදනම් කර ගෙන කාලීන වැදගත්කමකින් යුත් පර්යේෂණවල ද නිරත වේ.

# ස්තුතිය

මෙම අධ්‍යයනයට සහාය දීම සම්බන්ධයෙන් දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යුරෝපා සංගමයට සිය ස්තුතිය පුද කර සිටී. අධ්‍යයනය සඳහා මුල පුරන ලද්දේ CEPA ආයතනය ACTED ආයතනයේ හවුල්කාරිත්වය ඇතිව ක්‍රියාත්මක කරන *"සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම"* පිළිබඳ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ය. පුරවැසි වාර්තාපත් සමීක්ෂණය සැලසුම් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී CEPA ආයතනය මූලිකත්වය ගත්තේ ය.

මෙම අධ්‍යයනය සිදු කළ හැකි වූයේ මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, අතිරේක ලේකම්වරුන්, සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් (ACLGs), ප්‍රාදේශීය සභා ලේකම්වරුන් සහ මුලතිවු, මඩකලපුව හා මොණරාගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් විසින් අපට ලබා දෙන ලද සහාය නිසයි.

CEPA ආයතනය මොණරාගල දිස්ත්‍රික්කයේ සිවිල් සමාජ සංවිධානවලට ද සිය ස්තුතිය පළ කර සිටී.

| අනුක්‍රමික අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරි වසම | සිවිල් සමාජ සංවිධානයේ නම |
|---|---|---|---|
| | බඩල්කුඹුර | දේවතුර | එකමුතු ගොවි සංවිධානය |
| 2 | බඩල්කුඹුර | ඇල්ල | සරණ සුභසාධක සංගමය |
| 3 | බඩල්කුඹුර | මාළිගාතැන්න | දිලෙනතරු කාන්තා සංවිධානය |
| 4 | බඩල්කුඹුර | ලුණුගල ජනපදය | අරුණ ග්‍රාම සංවර්ධන සමිතිය |
| 5 | මඩුල්ල | පඟුර | ශ්‍රී ප්‍රඥාසේකර සමගි සුභසාධන සමිතිය |
| 6 | මඩුල්ල | නාමල්ඔය ජනපදය | නාමල්ඔය ජනපදය ග්‍රාමීය සමිතිය |
| 7 | මඩුල්ල | පංගුව | ළහිරු ගොවි සංවිධානය |
| 8 | මඩුල්ල | තල්කොටයාය | සමෘද්ධි ග්‍රාමීය සමිතිය |
| 9 | මඩුල්ල | මාගන්දාඔය ජනපදය | ප්‍රගති ගොවි සංවිධානය |
| 10 | මඩුල්ල | කොල්ලදෙණිය | දිනිඳු ගොවි සංවිධානය |
| 11 | මඩුල්ල | රිටිගහවත්ත | අසරණ සරණ මරණාධාර |
| 12 | මැදගම | බිබිලමුල්ල | දීප්ති කාන්තා සංවිධානය |
| 13 | මැදගම | ඇල්හේන | නවහිරු ළමා සමාජය |
| 14 | මැදගම | කොටබෝව | අලුත්වෙල එකමුතු පරිසර සාමාජිකයන්ගේ සමාජ සුභසාධන සමිතිය |
| 15 | මැදගම | බැදියාව | බැදියාව තිරසර සහයෝගිතා පදනම |
| 16 | මැදගම | පිටදෙණිය | සමෘද්ධි ග්‍රාමීය සමිතිය |
| 17 | මැදගම | මැල්ලගම | මැල්ලගම ග්‍රාම සංවර්ධන සමිතිය |
| 18 | මැදගම | රත්තණදෙණිය | වැවුමඩ එකමුතු සුභසාධන මරණාධාර සමිතිය |

මෙම කාර්ය සාර්ථක කර ගැනීමට සිය සහයෝගය දැක්වීම පිළිබඳව ආයතනය විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ සියලු සිවිල් සංවිධාන වලට ස්තුතිය පිරි නමන අතර මෙම අධ්‍යයනය සාර්ථක කිරීම සඳහා තොරතුරු සම්පාදනය කරමින් දෙමව්පියන් හා සිසුන් ලබා දුන් අගනා දායකත්වය වෙනුවෙන් ද CEPA ආයතනය සිය කෘතඥතාව පළ කර සිටී. මෙම අධ්‍යයනයේදී දත්ත සමීක්ෂකයන්ට මග පෙන්වමින් ඔවුන් සමග කටයුතු කරමින්, අනුෂා සිවලිංගම් හා ෂෙහානා මිර්සා යන ආයතන පර්යේශිකාවන් විසින් දක්වන ලද සහයෝගය වෙනුවෙන් ඔවුනට ද අප ස්තුතිය මෙහිදී හිමි වේ.

# කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| ACLG | සහකාර පළාත් පාලන කොමසාරිස් |
| EU | යුරෝපා සංගමය |
| CEPA | දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය |
| CSO | සිවිල් සමාජ සංවිධානය |
| CRC | පුරවැසි වාර්තාපත |
| eCRC | විද්‍යුත් පුරවැසි වාර්තාපත |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| DDE | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ |
| GNDs | ග්‍රාම නිලධාරි වසම් |
| PS | ප්‍රාදේශීය සභාව |
| WRDS | කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය |
| RDS | ග්‍රාම සංවර්ධන සමිතිය |

# රූප සටහන් මාලාව


1 වැනි රූප සටහන : තමන්ගේ ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි පාසල්වලට යාම ........................................ 8
2 වැනි රූප සටහන : තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට හේතු ........................................ 9
3 වැනි රූප සටහන : අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ සමස්ත තෘප්තිය ........................................ 10
4 වැනි රූප සටහන : අමතර පන්තිවලට සහභාගි වන සිසුන් ........................................ 10
5 වැනි රූප සටහන : බඩල්කුඹුර කොට්ඨාශය තුළ පහසුකම් පැවතීම හා භාවිතය ........................................ 11
6 වැනි රූප සටහන : මැදගම කොට්ඨාශය තුළ පහසුකම් පැවතීම හා භාවිතය ........................................ 12
7 වැනි රූප සටහන : මඩුල්ල කොට්ඨාසය තුළ පහසුකම් පැවතීම හා භාවිතය ........................................ 12
8 වැනි රූප සටහන : පාසල් විසින් ගෙවීම් කරන ලෙස ඉල්ලා සිටිනු ලබන අමතර ගෙවීම් ........................................ 13
9 වැනි රූප සටහන : පාසල්වලට කරන අමතර ගෙවීම් සඳහා ලදු පත් නිකුත් කිරීම ........................................ 14
10 වැනි රූප සටහන : පාසල් තුළ පවත්නා දඬුවම් පැමිණවීම ආශ්‍රිත ගැටලු ........................................ 14
11 වැනි රූප සටහන : සිසුන්ට ලබා දෙන දඬුවම් වර්ග ........................................ 15
12 වැනි රූප සටහන : පාසල් තුළ දී අසමාන ලෙස සැලකීම් සිදු වී ඇති අවස්ථා ........................................ 15
13 වැනි රූප සටහන : පාසල් තුළ දී අපයෝජන සිදු වී ඇති අවස්ථා ........................................ 16
14 වැන රූප සටහන : ගුරුවරුන් සම්බන්ධ ගැටලු ........................................ 16
15 වැන රූප සටහන : සේවා සම්පාදනය පිළිබඳ සමස්ත ශ්‍රේණිගත කිරීම් ........................................ 18
16 වැනි රූප සටහන : බඩල්කුඹුර කොට්ඨාශය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ ........................................ 19
17 වැනි රූප සටහන : මැදගම කොට්ඨාශය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ ........................................ 20
18 වැනි රූප සටහන : මඩුල්ල කොට්ඨාශය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ ........................................ 20

# අන්තර්ගතය


1. හැඳින්වීම ..... 1

1.1 ව්‍යාපෘතිය ..... 1

1.2 වාර්තාවේ විෂය පථය ..... 1

1.3 අධ්‍යයනයේ අරමුණු ..... 2

1.4 නියැදිකරණය ..... 2

1.5 ක්‍රමවේදය ..... 3

1.5.1 පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද? ..... 3

1.5.2 විද්‍යුත් පුරවැසි වාර්තාපතක් (eCRC) යනු කුමක් ද? ..... 4

1.5.3 විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම ..... 5

1.5.4 විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුත සේවාවන් හඳුනා ගැනීම ..... 5

1.5.5 කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම ..... 6

1.6 අධ්‍යයන ප්‍රදේශය ..... 6

2. ප්‍රධාන සොයා ගැනීම් ..... 8

2.1 ද්විතීය අධ්‍යාපන ප්‍රවේශය ..... 8

2.2 ද්විතීය අධ්‍යාපන සේවාවන් ආශ්‍රිත ගුණාත්මක බව හා තෘප්තිය ..... 9

2.3 පහසුකම් ..... 11

2.4 අමතර ගෙවීම් ..... 13

2.5 වෙනත් අපහසුතා ..... 14

3. ද්විතීය අධ්‍යාපන සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය ..... 17

4. ks¾foaY ..... 19

4.1 වැඩි දියුණු කළ යුතු සේවා අංශ ..... 19

4.1.1 වහා ම අවධානය යොමු කළ යුතු අංශ ..... 19

4.1.2 සේවා වැඩි දියුණුව සඳහා වන යෝජනා ..... 21

4.1.3 වෙනත් සලකා බැලීම් ..... 21

4.2 ඉදිරි මාවත ..... 21

# 1. හැඳින්වීම

## 1.1 ව්‍යාපෘතිය

යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත *"සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම"* ව්‍යාපෘතියේ අභිමතාර්ථය වන්නේ වඩාත් හොඳ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම හා රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා රජයේ ආයතන සමග සහයෝගී වීමට සිවිල් සමාජ සංවිධාන (CSOs) සතු හැකියාව ශක්තිමත් කිරීම, වැඩි දියුණු කිරීම සහ ඒ අතර සේවා සම්පාදකයන්ගේ වග වීම සහතික කිරීම යි. ACTED ආයතනය සහ CEPA ආයතනය පහත දැක්වෙන ව්‍යාපෘති ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගීව කටයුතු කරමින් සිටී. 2018 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසයන්හි දී මොණරාගල, මඩකලපුව හා මුලතිවු දිස්ත්‍රික්ක වල මෙම අධ්‍යයනයේ පාදක සමීක්ෂණය සිදු කරනු ලැබූ අතර, මෙම ප්‍රගති සමීක්ෂණය සඳහා වන දෙවන සමීක්ෂණය 2018 වසරේ සැප්තැම්බර් මාසයේදී සිදු කරන ලද්දේ පළාත්පාලන ආයතන වල සිදු වූ ප්‍රගතිය විමසා බැලීමේ අපේක්ෂාවෙනි.

පහත දැක්වෙන ප්‍රතිඵල (R1 සහ R2) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය ACTED ආයතනයට පැවරී ඇත.

- R1 - සිවිල් සමාජ සංවිධානවලට සිය විධි නියෝගයන් ක්‍රියාත්මක කිරීමට තිබෙන හැකියාව සහ ප්‍රාදේශීය සමාජ සංවර්ධන ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව නිරත වීමට තිබෙන හැකියාව වැඩි දියුණු කෙරේ.
- R2 - සහභාගීත්ව බහුපාර්ශ්වීය ප්‍රවේශයක් මගින් සමාජ සේවාවන් ආශ්‍රිත ප්‍රාදේශීය අවශ්‍යතා හා අඩුපාඩුකම් හඳුනා ගැනෙන අතර සිවිල් සමාජ සංවිධාන සහ රජයේ ආයතන විසින් විසඳුම් ලබා දීමට කටයුතු කෙරේ.

පහත දැක්වෙන ප්‍රතිඵලය (R3) සාක්ෂාත් කර ගැනීමේ කර්තව්‍යය CEPA ආයතනයට පැවරී ඇත.

- R3 - සේවා සම්පාදකයන් ලවා වඩාත් හොඳින් වග වීම සඳහා සමාජ සේවා සම්පාදනය/ඒවායේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම වැඩි කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කෙරෙන අතර ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීම සඳහා යහභාවිතයන් ප්‍රචලිත කෙරේ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස CEPA ආයතනය ක්‍රියාකාරකම් ගණනාවකට මුල පිරිය යුතු අතර ඒවා පහත දැක්වේ:

- විවිධ මට්ටම්වල රාජ්‍ය සේවා සම්පාදකයන් හඳුනා ගැනීම,
- ඉලක්ක කෙරෙන සිවිල් සමාජ සංවිධානවලින් සංගණනකරුවන් තෝරා ගැනීම,
- සංගණනකරුවන්ට පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය පිළිබඳ පුහුණුවක් ලබා දීම,
- ප්‍රශ්නාවලි සකස් කිරීමට හා දත්ත රැස් කිරීමට පහසුකම් සැපයීම,
- ප්‍රතිඵල රජයේ ආයතන වෙත යොමු කිරීම සහ සේවාවන් ආශ්‍රිත අඩුපාඩුකම් සපුරාලීම සඳහා සැලසුම් සකස් කිරීමට ඒවාට සහාය වීම.

## 1.2 වාර්තාවේ විෂය පථය

මෙම වාර්තාව මගින් **මොණරාගල දිස්ත්‍රික්කයේ** තෝරාගත් ග්‍රාමනිලධාරී වසම් ඇසුරෙන් **ද්විතියික අධ්‍යාපන සේවාව** පිළිබඳව වන සොයා ගැනීම් ඉදිරිපත් කරනු ලැබේ. මෙම සමීක්ෂණය 2018 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසයන් වල දී කරන ලද පළමු සමීක්ෂණයෙන් පසු 2018 සැප්තැම්බර් මාසයේ කරන ලද දෙවැනි සමීක්ෂණය වන අතර සමීක්ෂණය ඇසුරෙන් ආවරණය කරන ලද්දේ **බඩල්කුඹුර, මැදගම** හා **මඩුල්ල** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ග්‍රාම සේවා වසම් වේ.

## 1.3 අධ්‍යයනයේ අරමුණු

අධ්‍යයනයේ විශේෂිත අරමුණු මෙසේ වේ:

(i) රාජ්‍ය සේවාවන් වෙත පවත්නා ප්‍රවේශය, ඒවායේ ගුණාත්මක බව හා එම සේවාවන් සැබවින් පරිහරණය කරන්නන්ගේ තෘප්තිය තක්සේරු කිරීමේ මෙවලමක් ලෙස සහ සමාජීය වගවීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත යොදා ගැනීම,

(ii) මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ක්‍රියාකාරීව ප්‍රචලිත කිරීම සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ඉටු කර ගැනීම සඳහා ඒවා යොදා ගැනීම,

(iii) වෙනත් දිස්ත්‍රික්කවල වෙනත් රාජ්‍ය ආයතන තුළ මීට සමාන ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා සැබෑ පරිහරණය කරන්නන්ගේ මෙම අත්දැකීම ඉදිරිපත් කිරීම.

## 1.4 නියැදිකරණය

විද්‍යුත් පුරවැසි වාර්තාපත ප්‍රධාන වශයෙන් සේවාවන් දෙවර්ගයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කෙරිණ. එකක් ද්විතීය නිදහස් අධ්‍යාපනය ද අනෙක ප්‍රාදේශීය සභා විසින් සැපයෙන සේවා ද විය. විද්‍යුත් පුරවැසි වාර්තාපත ACTED ආයතනය විසින් මුලතිවු, මඩකලපුව හා මොණරාගල දිස්ත්‍රික්කවලින් තෝරා ගන්නා ලද ග්‍රාම නිලධාරි වසම් 60ක් ආවරණය කළේය. සමීක්ෂණය සඳහා යොදා ගැනුණු නියැදියේ විශාලත්වය තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 60න් කුටුම්බ 1,200ක් නොහොත් ඒ ඒ දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් 20න් කුටුම්බ 400ක් විය යුතු යැයි තීරණය කෙරිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් 20න් තෝරා ගැනුණු කුටුම්බ 400 අනතුරුව ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සැබෑ සේවාලාභීන් සංඛ්‍යාව අනුව බෙදා වෙන් කරන ලදි.


මඩකලපුව, මුලතිවු හා මොණරාගල යන දිස්ත්‍රික්ක තුනේ දී ම නියැදිකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලද්දේ අදියර ගණනාවකිනි. පළමු අදියරේ දී ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා කුටුම්බ පිළිබඳ දත්ත පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් විසින් පාසල් යන වයසේ (5 සිට 13 ශ්‍රේණිය දක්වා) දරුවන් සිටින කුටුම්බ හඳුනා ගෙන ලැයිස්තුගත කෙරිණ. සමීක්ෂණය සඳහා යොදාගත් කුටුම්බ නියැදිය ඒ ඒ ග්‍රාම නිලධාරි වසමෙන් අපේක්ෂිත නියැදියේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් අහඹු ලෙස තෝරා ගැනිණ. මේ අතර ප්‍රාදේශීය සභා සේවාවන් පිළිබඳ සමීක්ෂණය සඳහා තෝරා ගත් නියැදිය ද මෙම කුටුම්බ යටත් පිරිසෙයින් ප්‍රාදේශීය සභා විසින් සම්පාදනය කෙරෙන එක් රාජ්‍ය සේවාවක්වත් භාවිත කරන්නේය යන නිර්ණායකය පදනම් කර ගෙන ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ ක්‍රියාකාරී සිවිල් සමාජ සංවිධාන විසින් හඳුනා ගැනුණු ඉහත සඳහන් කරන ලද කුටුම්බ අතරින්ම තෝරා ගැනිණ. ඒ ඒ ග්‍රාම නිලධාරි වසම තුළ නියැදිකරණ ක්‍රියාවලිය සඳහා මුල පුරන ලද්දේ කුටුම්බ අනුපාතයන් සහ ග්‍රාම නිලධාරි වසම තුළ පවත්නා සියලු ගම්මාන නියෝජනය වන පරිදි වඩාත් පුළුල් ආවරණයක් සාක්ෂාත් කර ගත යුතු බව සිත තබා ගනිමිනි. සමස්තයක් ලෙස ගත් කල විද්‍යුත් පුරවැසි වාර්තාපත සඳහා කුටුම්බ 1,200ක් (මඩකලපුව දිස්ත්‍රික්කයෙන් 400ක්, මොණරාගල දිස්ත්‍රික්කයෙන් 400ක් සහ මුලතිවු දිස්ත්‍රික්කයෙන් 400ක්) සම්බන්ධ කර ගැනිණ. ගුණාත්මකබව පිළිබඳ සියලු පරීක්ෂාවන්ගෙන් පසුව විශ්ලේෂණය සඳහා ඒ අතරින් තෝරා ගැනුණු වලංගු නියැදිය තුළින් දිස්ත්‍රික්ක තුනේ ග්‍රාම නිලධාරි වසම් 60 ආවරණය විය.

නියදියට අදාළව අවශ්‍ය සියලුම කුටුම්බයන් මෙම දෙවන සමීක්ෂණය යටතේ ආවරණය කරන ලදී. කෙසේ වෙතත් මීට පෙර සමීක්ෂණය කරන ලද නිවසටම ගොස් තොරතුරු ගැනීම අත්‍යවශ්‍ය නොවන අතර පළමු සමීක්ෂණයේ දී ඇතැමුන් අධ්‍යයනයට භාජනය නොවී තිබුණද, අධ්‍යනයට බඳුන් කරන ලද ප්‍රදේශයේ පවුල් වලින් ලැබුණු සියලුම ප්‍රතිචාර හා එම සේවාන්ගේ යථා තත්වයන් පිළිබඳ සපයන ලද පිළිතුරු මෙම සියලුම ප්‍රදේශයන් හි සේවා සැපයුමට හා ඒවායේ ගුණාත්මක බවට අදාළ වේ.

නියැදිකරණයට මුල පුරන ලද්දේ පහත දැක්වෙන නියැදිකරණ ආකෘතිය පදනම් කර ගෙන ය.

| ජනගහනය (කුටුම්බ) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 95%) | කුටුම්බ පදනම් කර ගෙන තෝරා ගත යුතු නියැදියේ විශාලත්වය (විශ්වසනීයත්වයේ මට්ටම 90%) |
|---|---|---|
| 100 | 80 | 66 |
| 500 | 217 | 141 |
| 1,000 | 278 | 164 |
| 5,000 | 357 | 189 |
| 10,000 | 370 | 192 |
| 30,000 | 379 | 195 |
| 50,000 | 381 | 195 |
| 100,000 | 383 | 196 |
| 200,000 | 383 | 196 |

නියැදිකරණ ක්‍රියාවලිය සඳහා පහත දැක්වෙන ඡායාරූපය වැනි චන්ද්‍රිකා ඡායාරූප යොදා ගන්නා ලද අතර, ඒ ඔස්සේ මොණරාගල දිස්ත්‍රික්කයේ අධ්‍යයනය කරන ලද ප්‍රදේශ පහත චන්ද්‍රිකා ඡායාරූපය ඇසුරින් හඳුනාගත හැකිය.




# 1.5 ක්‍රමවේදය

## 1.5.1 පුරවැසි වාර්තාපතක් යනු කුමක් ද?

පුරවැසි වාර්තාපත (CRC) යනු රාජ්‍ය සේවාවන්ගේ කාර්ය සාධනය පිළිබඳව ක්‍රමානුකූල සහ සැබවින් පරිභරණය කරන්නන්ගේ ප්‍රතිචාර ලබා ගත හැකි සරල නමුත් බලගතු මෙවලමකි. එය සැබවින් පරිභරණය කරන්නන්ගෙන් රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක බව හා ප්‍රමාණවත් බව පිළිබඳ ප්‍රතිචාර රැස් කර ගන්නා සහභාගිත්ව සමීක්ෂණයකි. පුරවැසි වාර්තාපත සේවා සම්පාදකයන් සමග සංවාදයක යෙදීමට සහ රාජ්‍ය සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ඔවුන් ලවා වග වීමට ප්‍රජාවන්, සිවිල් සමාජ සංවිධාන හෝ පළාත් පාලන ආයතන වෙත විද්‍යානුකූල පදනමක් හා ප්‍රායෝගික ප්‍රවේශයක් සම්පාදනය කරයි. පුරවැසි වාර්තාපත මුලින් ක්‍රියාත්මක කරන

ලද්දේ නාගරික පරිසරයන් තුළ වුවත් දැන් එය රාජ්‍ය සේවා සම්පාදනයේ තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා භූගෝලීය පසුබිම් සහ දේශීය වාතාවරණයන් ගණනාවක දී ම යොදා ගැනේ.

පුරවැසි වාර්තාපත ප්‍රතිලාභ ගණනාවක් අත් කරදෙයි. තමන් සම්පාදනය කරන රාජ්‍ය සේවාවන් මහජනයා වෙත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අයුරින් ළඟා වන්නේ දැයි සොයා ගැනීමේ පිරිවැය ඵලදායක ක්‍රමවේදයක් මෙමඟින් සේවා සම්පාදකයන් වෙත සැපයේ. එමෙන් ම එය තමන්ට ලැබෙන සේවාවන්ගේ ගුණාත්මක බව, කාර්යක්ෂමතාව හා ප්‍රමාණවත් බව සම්බන්ධයෙන් ප්‍රතිචාර සහ සේවා සම්පාදකයන් සමග ගනුදෙනු කරන විට තමන් මුහුණ දෙන ප්‍රශ්න පළාත් පාලන ආයතන වෙත ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන් වෙත පිරිනමයි. විවිධ සේවා සම්පාදකයන් සිටින ප්‍රදේශවල දී විවිධ සේවාවන් සම්බන්ධයෙන් පරිහරණය කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම් සසඳා බැලීමට හැකියාව ලැබේ. මෙලෙස (පරිහරණය කරන්නන්ගේ තෘප්තිය පදනම් කර ගෙන) සිදු වන තක්සේරුව අනතුරුව යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් සේවා සම්පාදකයන්ගේ කාර්ය සාධනය මැන බැලිය හැකි 'වාර්තාපතක්' බවට පත් වේ. පුරවැසි වාර්තාපතෙන් පිළිබිඹු වන්නේ රාජ්‍ය සේවාවන් පරිහරණය කරන්නන්ගේ සැබෑ අත්දැකීම් නිසා පුරවැසි වාර්තාපත රාජ්‍ය සේවාවන් පිළිබඳව කෙරෙන මත විමසුම් සමග පටලවා නොගත යුතුය. උදාහරණයක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගන්නා සමීක්ෂණවල දී ඉලක්ක කර ගැනෙන්නේ යම් යම් සේවාවන් භාවිත කර ඇති සහ/හෝ අදාළ රාජ්‍ය ආයතන සමග ගනුදෙනු කර ඇති පුද්ගලයන් පමණකි.

රටවල් 20කට වැඩි ගණනක දී ප්‍රාදේශීය හා ජාතික ආණ්ඩු සහ සිවිල් සමාජ සංවිධානවල පටන් සංවර්ධන හවුල්කරුවන් දක්වා වූ විවිධ ආයතන විසින් පුරවැසියන් සම්බන්ධ කර ගැනීමේ හා සේවාවන් වැඩි දියුණු කිරීමේ මෙවලමක් ලෙස පුරවැසි වාර්තාපත් යොදා ගනු ලැබ ඇත. මෙම මෙවලම සාමාන්‍යයෙන් දත්ත උත්පාදනය කරන්නේ පුරවැසියන් සහ ආණ්ඩුව එකිනෙකාට හමු වන තැන දී නිසා බොහෝ බලපෑම් ක්ෂේත්‍රවලදී එය ප්‍රයෝජනයට ගත හැකි ය. උදාහරණයක් ලෙස එයට රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් පෝෂණය කිරීමේ, පාලන ක්‍රියාවලි හා සේවා සම්පාදන යන්ත්‍රණයන් නැවත සකස් කිරීමේ සහ රාජ්‍ය හා ප්‍රජා ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ පදනම බවට පත් විය හැකි ය.

පුරවැසි වාර්තාපතේ එක් කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ විවෘත ප්‍රතිචාරයන් නොදක්වන ප්‍රජාවන්ට සිය අදහස් පළ කිරීම සඳහා ඉඩක් සලසා දීමට ඊට තිබෙන හැකියාව යි. මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල පිහිටි ඉතා දුර බැහැර හා ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදු නොවන ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ මෙම සුවිශේෂ අධ්‍යයනයේ දී සිදු වූයේ එය යි. මෙහි අභිමතාර්ථය වූයේ තෝරා ගැනීම් තමන් විසින් ම කරනු ලැබීම සඳහා, තම අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා සහ ආත්ම විශ්වාසයෙන් යුතුව තිරසර ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රජාවන් බල ගැන්වීම යි. මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා CEPA ආයතනය ප්‍රජා පාදක පර්යේෂණ ඔස්සේ හඳුනා ගැනුණු ප්‍රමුඛතාව දෙන ලද සේවාවන් තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කළේ ය. මෙහි අරමුණ වූයේ පුරවැසියන්ට හිතැති සහ අයිතිවාසිකම් පදනම් කර ගත් දැක්මකින් යුතුව දැනට පවත්නා භාවිතයන්ට හා ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම යි.

## 1.5.2 විද්‍යුත් පුරවැසි වාර්තාපතක් (eCRC) යනු කුමක් ද?

විද්‍යුත් පුරවැසි වාර්තාපත (eCRC) යනු නවීනතම තාක්ෂණයේ බලය හා පහසුව ප්‍රයෝජනයට ගනිමින් පුරවැසි වාර්තාපත් ක්‍රියාත්මක කිරීමේ විප්ලවීය ප්‍රවේශයකි. විද්‍යුත් පුරවැසි වාර්තාපත ඇන්ඩ්‍රොයිඩ් මෙහෙයුම් පද්ධතිය පදනම් කර ගත් ජංගම දුරකථන මෘදුකාංග යෙදුමක් මගින් විශ්වසනීය ආකාරයෙන් පුරවැසි ප්‍රතිචාර රැස් කිරීමටත් රැස් කරගත් තොරතුරු ඒ මොහොතේ ම විශ්ලේෂණය කිරීමට හා වාර්තා කිරීමටත් හැකියාව ලබා දෙයි. විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලිය අංග කිහිපයකින් සමන්විත වේ:

**(a) සමීක්ෂණය පැවැත්වීම**

ජංගම දුරකථන මෘදුකාංග යෙදුමක් යොදා ගනිමින් ටැබ්ලට් පරිගණකයක් ඔස්සේ මහජන ප්‍රතිපෝෂණ හා අත්දැකීම් පිළිබඳ විද්‍යාත්මක නියැදි සමීක්ෂණයක් පවත්වනු ලැබේ. ජංගම දුරකථන/ටැබ්ලට් පරිගණකවල පවත්නා GPS සෙවුම් පද්ධතිය දත්ත රැස් කර ගත් ස්ථානය පෙන්නුම් කරන නිසා දත්ත රැස් කිරීමේ විශ්වසනීයත්වය වැඩි දියුණු වේ.

#### (b) තත්ත්ව පාලනය සඳහා දූරස්ථ නිරීක්ෂණය

වෙබ් ජාලය පදනම් කර ගත් සමීක්ෂණ කළමනාකරන මොඩියුලය ඒ මොහොතේ ම සමීක්ෂණයේ ප්‍රගතිය සොයා බැලීමට සමීක්ෂණ කළමනාකරුවන්ට හැකියාව ලබා දෙයි. මෙම මොඩියුලය දූරස්ථ නිරීක්ෂණයට සහ සමීක්ෂණ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීමට හැකියාව ලබා දෙන අතර එම නිසා වැඩි තත්ත්ව පාලනයක් කළ හැකි බව සහතික කරයි.

#### (c) දත්ත විශ්ලේෂණය

විද්‍යුත් පුරවැසි වාර්තාපත් ක්‍රියාවලියේ කොටසක් ලෙස නිර්මාණය කරන ලද ඔන්ලයින් මෙවලම් පුවරුව (Dash Board) හා දත්ත විශ්ලේෂණ මෙවලම් (Data analysis tool) විවිධ පාර්ශවකරුවන්ගේ (උදා. ප්‍රතිපත්ති සම්පාදකයන්, පරිපාලකයන්, දේශපාලන නියෝජිතයන් හා පුරවැසියන් යනාදි) තොරතුරු අවශ්‍යතා සපුරයි. සමීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරිපත් කෙරෙන්නේ පහසුවෙන් අවබෝධ කර ගත හැකි ප්‍රස්තාර, වගු හා සිතියම් මගිනි. කාර්ය සාධන මට්ටම් පහසුවෙන් නිගමනය කිරීමට පහසුකම් සැපයීම සඳහා සරල වර්ණ සංකේත යොදා ගනු ලැබේ.

විද්‍යුත් පුරවැසි වාර්තාපත වාර්තාකරණය සඳහා ජංගම ටැබ්ලට් පරිගණක හා නවීනතම තාක්ෂණය යොදා ගන්නා නිසා එහි වාසි කිහිපයක් පවතී:

- එය ඉතා නිවැරදි දත්ත උත්පාදනය කරයි.
- ක්ෂණික ප්‍රතිඵල ලබා දෙයි.
- සමීක්ෂණය පැවැත්වෙන භූගෝලීය ස්ථානයේ සිතියමක් මත දත්ත/ප්‍රතිඵල විදහා දැක්වීමට හැකියාව ලබා දෙයි;
- එක් වරක් පමණක් ආයෝජන පිරිවැය දරා ක්‍රියාකාරකම නැවත නැවතත් කිරීමට ඉඩ සලසා දෙන නිසා එය වඩාත් පිරිවැය ඵලදායක ය.

## 1.5.3 විද්‍යුත් පුරවැසි වාර්තාපත සැලසුම් කිරීම

මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය පිණිස මඩකලපුව, මොණරාගල හා මුලතිව් යන ඒ ඒ දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාම නිලධාරි වසම් 20ක විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණය පැවැත්වීමට සැලසුම් කරනු ලැබිණ. සමීක්ෂණය සැලසුම් කරන ලද්දේ අධ්‍යයනය සඳහා හඳුනාගත් ප්‍රදේශවල ප්‍රාදේශීය සභා සේවා සම්පාදනය සහ ද්විතීය අධ්‍යාපන සේවාවන්හි තත්ත්වය ආවරණය කිරීම සඳහා ය. සමීක්ෂණයේ කාල සීමාව සහ අනෙක් කාර්ය සම්පාදන කටයුතු පිළිබඳව අවසන් තීරණයකට එළඹුණේ අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක ලේකම්වරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ප්‍රාදේශීය සභා ලේකම්වරුන්ගෙන් උපදෙස් ලබා ගනිමිනි. සමීක්ෂණය ක්‍රියාත්මක කරන ලද්දේ ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන (CSO) කණ්ඩායමක් විසිනි. දිස්ත්‍රික්ක තුන තුළ විද්‍යුත් පුරවැසි වාර්තාපත් සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම සඳහා CEPA ආයතනයේ පර්යේෂකයන්ගේ සහ ACTED ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ CEPA ආයතනය විසින් සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් කණ්ඩායම සම්පත් පුද්ගල සංචිතයක් ලෙස පුහුණු කරන ලදි.

## 1.5.4 විද්‍යුත් පුරවැසි වාර්තාපත යොදා ගෙන සමීක්ෂණය කළ යුත සේවාවන් හඳුනා ගැනීම

ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයන් සමග පැවැත් වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා (FGDs) අතරතුර දී ගැටලු සහිත සහ දියුණු කිරීමේ මූලික අවශ්‍යතාව පවතින ක්ෂේත්‍ර ලෙස ඉස්මතු වූයේ (i) ප්‍රාදේශීය සභා සේවා සහ (ii) ද්විතීය අධ්‍යාපන සේවා (5 වසර-13 වසර) සම්පාදනය යි. මෙම ප්‍රමුඛතා, ACTED ග්‍රාම සංවර්ධන සැලසුම්වල (VDPs) විස්තර කර ඇති ප්‍රමුඛතාවන් සමග ද ගැළපේ.

මේවා අතරින් වැඩි දියුණු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනුණේ ප්‍රජාව සහ සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් විසින් කරන ලද ශ්‍රේණිගත කිරීම් යොදා ගනිමිනි.

අධ්‍යාපන සේවාවන් සම්බන්ධයෙන් ගත් කල ප්‍රජාව සමග එක්ව මූල පුරන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ ද්විතීය අධ්‍යාපනය ප්‍රමුඛතාවක් ලෙස හඳුනා ගන්නා ලදි.

### 1.5.5 කාර්ය සාධන දර්ශක නිර්මාණය කිරීම

දිස්ත්‍රික්කයන් තුනෙහි ප්‍රජා කණ්ඩායම්, කලාප අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන් හා පළාත් පාලන බලධාරීන් සමග පැවැත්වූ උපදෙස් විමසීම් මාලාවකින් පසුව ද්විතීය අධ්‍යාපන සේවාවන්ට සම්බන්ධිතව විශේෂිත දර්ශක සමූහයක් හඳුනා ගන්නා ලදි. ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයේ කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා පහත දැක්වෙන කාර්ය සාධන දර්ශක තෝරා ගනු ලැබිණි.

| ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයේ පැතිකඩවල් | දර්ශක |
|---|---|
| ප්‍රවේශය | • ග්‍රාම නිලධාරි වසම තුළ/පිටත පාසල්වලට යාම<br>• නිතිපතා පාසල් යාම<br>• පාසල් නොයාමට හේතු<br>• අමතර පන්තිවලට යාම |
| ගුණාත්මක බව | • ගුණාත්මක බව සම්බන්ධ තෘප්තිය |
| එහසුකම් | • පැවතීම<br>• තෘප්තිය |
| ගුරුවරු | • ප්‍රමාණවත් ගුරුවරු සිටීම<br>• ඉගැන්වීමේ ගුණාත්මක බව<br>• ගුරුවරුන්ගේ හැසිරීම<br>• ඉගැන්වීම් ප්‍රවේශය |
| අපහසුතා | • දඬුවම්<br>• අපයෝජන<br>• අසමාන ලෙස සැලකීම්<br>• සැඟවුණු වියදම් |

## 1.6 අධ්‍යයන ප්‍රදේශය

**මොණරාගල දිස්ත්‍රික්කයේ** දී මෙම අධ්‍යයනය **බඩල්කුඹුර මැදගම හා මඩුල්ල** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය සභා සහ කලාප අධ්‍යාපන කාර්යාල යටතේ පවත්නා ප්‍රදේශ ගණනාවක් ආවරණය කරන බව පහත වගුවෙන් පෙනේ.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/ප්‍රාදේශීය සභාව | ග්‍රාම නිලධාරි වසම්වල නම් | මුළු ගම්මාන සංඛ්‍යාව | කුටුම්බ සංඛ්‍යාව |
|---|---|---|---|
| මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/ මඩුල්ල ප්‍රාදේශීය සභාව | නාමල්ඔය ජනපදය | 5 | 318 |
| | තල්කොටයාය | 2 | 229 |
| | රිටිගහවත්ත | 3 | 278 |
| | පංගුව | 3 | 286 |
| | පඟුර | 4 | 213 |
| | කොල්ලදෙණිය | 12 | 412 |
| | මාගන්දාඔය ජනපදය | 4 | 248 |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/ප්‍රාදේශීය සභාව | ග්‍රාම නිලධාරි වසම්වල නම් | මුළු ගම්මාන සංඛ්‍යාව | කුටුම්බ සංඛ්‍යාව |
|---|---|---|---|
| මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/මැදගම ප්‍රාදේශීය සභාව | රත්තනදෙණිය | 6 | 372 |
| | මැල්ලගම | 4 | 432 |
| | පිටදෙණිය | 4 | 296 |
| | බැදියාව | 4 | 408 |
| | කොටබෝව | 6 | 383 |
| | බිබිලමුල්ල | 3 | 328 |
| | ඇල්හේන | 2 | 280 |
| බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය/බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | මාළිගාතැන්න | 3 | 394 |
| | ඇල්ල | 4 | 305 |
| | කොටමුදුන | 5 | 410 |
| | ලුණුගල ජනපදය | 5 | 532 |
| | දේවතුර | 4 | 699 |
| | මියනකඳුර | 2 | 484 |


# 2. ප්‍රධාන සොයා ගැනීම්

පුරවැසි වාර්තාපත් සමීක්ෂණය මගින් අධ්‍යයන ප්‍රදේශයේ ද්විතියික අධ්‍යාපනය ලබන දරුවන් සඳහා පවතින ප්‍රවේශය, පහසුකම්, ගුණාත්මක බව හා සේවාවට අදාළ ගැටලු පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි. පහත දැක්වෙන එක් එක් අංශ ඇසුරෙන් 2018 වසරේ මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ සිදු වූ වෙනස්කම පිළිබඳව අධ්‍යයනය කරන අතර ඒ අනුව පළමු පුරවැසි වාර්තාපත් සමික්ෂණයත්, දෙවන පුරවැසි වාර්තාපත් සමික්ෂණයත් අතර තුර සිදු වූ වෙනස්කම් පිළිබඳව සංසන්දනයක් කරනු ලැබේ. ඒ අනුව **පළමු සමික්ෂණයේ** දත්ත **පළමු** යන්නෙන් පෙන්නුම් කරන අතර **දෙවන සමීක්ෂණයේ** දත්ත **දෙවන** යන්නෙන් පෙන්නුම් කරයි.

## 2.1 ද්විතීය අධ්‍යාපන ප්‍රවේශය

**1 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරනු ලබන්නේ ඉගෙනීම සඳහා තම ග්‍රාම සේවා වසමට අයත් පාසලකට සහභාගී වන සිසුන්ගේ ප්‍රතිශතය යි. පහත දැක්වෙන දත්ත මගින් පෙන්නුම් කරන පරිදි දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණය වන විට සලකා බලන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සියල්ලෙහිම තම වසමේ පාසලකට දරුවන් යාමේ ප්‍රතිශතය ඉහල ගොස් තිබෙන බව පෙනී යයි. එම තත්වයට බලපාන ලද එක හේතුවක් වන්නේ පළමු සමික්ෂණයේදී දත්ත ලබා ගනු ලැබූ පවුල් සියලෙන්ම දෙවන සමීක්ෂණයේදී තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම නිසා ඇතැම් විට එම වසමේම වෙනත් පවුල් වලින් දත්ත ලබා ගැනීමයි. දත්ත සමික්ෂණයන්ට වෙනත් නිවාස වලට යාමට සිදුවුයේ පෙර සමීක්ෂණයට ලක් කරන ලද නිවාස වල පුද්ගලයන් නොසිටීම නිසාය. එමෙන් ම දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණය තුළදී ඉතා දුර බැහැර සහ අඩු පහසුකම් පැවති ප්‍රදේශ බොහොමයක් අධ්‍යයනය කරනු ලැබුණු. එම ප්‍රදේශයන් වල පැවතී දුෂ්කර බවත්, දරිද්‍රතාවයත් නිසා බොහෝමයක් දෙමවුපියන් තම දරුවන් තම වසමේම පාසැලට යවන තත්වයක් දක්නට ලැබුණි. එම හේතුව නිසා සිසුන් වැඩි පිරිසක් තම වසමේ පාසලට යන බව දෙවන වර්තාපත් සමීක්ෂණය ඇසුරෙන් පෙන්නුම් කරයි.


**1 වැනි රූප සටහන : තමන්ගේ ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි පාසල්වලට යාම**




තම ග්‍රාම සේවා වසමෙන් පිටත පාසලකට සහභාගී වීමට හේතු ලෙස ප්‍රතිචාර දැක්වූන් දක්වන ලද හේතු **2 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරයි. පළමු දත්ත සමීක්ෂණ දත්ත අනුව පෙන්නුම් කරන ලද්දේ තම වසමෙන් පිටත පාසලකට දරුවන් යාමට හේතුව වන්නේ තම වසමේ පාසලේ පන්ති කිසියම් මට්ට්ටමක දක්වා පමණක් පවතින බැවින් වෙනත් පාසලකට යාමට සිදුවන බවයි. ඒ අනුව පෙන්නුම් කරන්නේ දරුවන් ඉහළ වසර වලට සහභාගී වීමට වසමෙන් පිටත් පාසල් වලට යාමට සිදු වන බවයි. කෙසේ වෙතත් දෙවන කාල සීමාවේදී මෙම තත්වයේ තරමක අඩු වීමක් පෙන්නුම් කර තිබේ. පළමු සමීක්ෂණයෙන් ඉස්මතු වූ තවත් හේතුවක් වූයේ තම වසමේ පාසලක් නොමැති නිසා වසමෙන් පිටත පාසලකට යාමට සිදුවන බවයි. දෙවන කාල සීමාවේදී එම තත්වයේ කිසියම් අඩුවීමක් වාර්තා වේ. විශේෂයෙන්ම මෙම අඩුවීම මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ

හඳුනා ගත හැකිය. **2 වැනි රූප සටහන** මඟින් පෙන්නුම් කරන පරිදි, තම වසමෙන් පිටත පාසලකට දරුවන් සහභාගී වීම කෙරෙහි පවතින අනෙක් හේතුව ලෙස ඉස්මතුව තිබෙන්නේ තම වසමේ පාසලේ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවීමයි.

**2 වැනි රූප සටහන : තමන්ගේ ග්‍රාම නිලධාරි වසමෙන් පිටත පිහිටි පාසල්වලට යාමට හේතු**





## 2.2 ද්විතීය අධ්‍යාපන සේවාවන් ආශ්‍රිත ගුණාත්මක බව හා තෘප්තිය

**3 වැනි රූප සටහන** මඟින් පෙන්නුම් කරන පරිදි දරුවන් ලබන අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳව දෙමවුපියන් සහ පාසල් යන දරුවන් විසින් පළමු සහ දෙවන සමීක්ෂණයේදී දක්වන ලද අදහස් පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් සපයයි. ඒ අනුව දෙවන සමීක්ෂණයේ දී සළකා බලන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහිම ඉහළ තෘප්ති මට්ටමේ අඩු වීමක් පෙන්නුම් කරයි. බඩල්කුඹුර සහ මැදගම යන ප්‍රාදේශ අධ්‍යයනයේදී දෙවන සමීක්ෂණයේදී තමන් අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳව මධ්‍යස්ත මට්ටම ඉහල යාමක් පෙන්නුම් කරයි. මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෙවන සමීක්ෂණ කාල සීමාව තුළ තමන්ට ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මක තත්වයේ අඩු බව බොහෝ දෙනෙකු වාර්තා කර තිබේ. මෙම හේතුව කෙරෙහි බලපාන එක හේතුවක් ව පවතින්නේ පළමු සමීක්ෂණය පවතී කාලයේ පාසලේ පළමු වාරය ආරම්භය නිසා අදාළ පහසුකම් හා ඉගැන්වීම් කටයුතු සාර්ථකව සිදුවීමත්, දෙවන සමීක්ෂණ කාලය වන විට එම තත්වයේ කිසියම් අඩු වීමක් වාර්තා වීමත් ය. අධ්‍යාපනයේ ගුණාත්මක බව අඩු වීම කෙරෙහි බලපා තිබෙන ප්‍රධාන හේතු සහ අභියෝග තත්වයන් ලෙස ගුරුවරුන්ට පවතින ප්‍රවාහන ගැටලු, වැසි සහිත කාලසීමා වලදී මාර්ගවල පවතින ගැටලු ආදිය ඉස්මතු වී තිබෙන අතර ඊට අමතරව අධ්‍යාපනයේ ගුණාත්මක බව අඩු වීම කෙරෙහි පහත සාධක පොදුවේ බලපා තිබේ.


- නියමිත විෂයන් සඳහා අවශ්‍ය ගුරුවරු නොමැතිකම.
- ගුරුවරුන් නියමිත වෙලාවට පාසලට නොපැමිණීම.
- නියමිත වේලාවන්ට බස් රථයක් නොමැතිකම හා දුර්වල මාර්ග තත්වය හේතුවෙන් ගුරුවරුන්ගේ පැමිණීමේ අපහසුතා.
- අමතර පන්ති සඳහා අවස්ථාවක් නොපැවතීම හා ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් හෝ තරඟ සඳහා පාසලේ ඉඩකඩ අවම වීම.
- ප්‍රායෝගික පන්ති පැවැත්වුවද ඒවා සැලකියයුතු ගුණාත්මක බවකින් හෝ අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම.
- පාසලේ 9 වසර දක්වා පමණක් පංති පැවතීම.
- අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිකම.

**3 වැනි රූප සටහන : අධ්‍යාපනයේ ගුණාත්මක බව පිළිබඳ සමස්ත තෘප්තිය**




**4 වැනි රූප සටහන** මඟින් පෙන්නුම් කරනු ලබන්නේ සළකා බලන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහි බාහිර පන්ති වලට සහභාගී වන සිසුන්ගේ ප්‍රතිශතය යි.

**4 වැනි රූප සටහන : අමතර පන්තිවලට සහභාගි වන සිසුන්**




දෙවන පුරවැසිපත් සමීක්ෂණය මගින් පෙන්නුම් කරන පරිදි සැලකියයුතු මට්ටමකින් දරුවන් බාහිර පන්ති වලට සහභාගී වීමේ අඩුවක් මැදගම, සහ මඩුල්ල කොට්ඨාශ වලින් වාර්තා වේ. බඩල්කුඹුර කොට්ඨාශයේ දරුවන්ගේ බාහිර පන්ති වලට සහභාගී වීමේ තරමක අඩු වීමක් පෙන්නුම් කරයි. දෙවන සමීක්ෂණ කාල සීමාව තුළ දරුවන්ගේ බාහිර පන්ති වලට සහභාගී වීමේ අඩුවක් පෙන්නුම් කිරීමට බලපාන ලද හේතුවක් ලෙස ඉස්මතු වූ කරුණක් වන්නේ පැවති කාලගුණික තත්වයන් මත දරුවන් පන්ති වලට යැවීමට තරම් දෙමවුපියන්ට ආදායම තත්වයක් නොපැවති බවයි. දරුවන් බාහිර පන්ති වලට යාමේ අඩුවක් පෙන්නුම් කිරීම සඳහා බලපාන ලද අනෙක් කරුණ වන්නේ රජයේ විභාග ආසන්න වීමත් සමඟ පාසල් මගින් පාසලේම අතිරේක පන්ති පවත්වන නිසා දරුවන් බාහිර පන්ති වලට යාමේ ඉඩකඩ අඩු වීමයි.

බාහිර පන්ති වලට සිසුන් සහභාගී වීමේ අඩුවක් පෙන්නුම් කරනු ලැබුවත්, දෙවන සමීක්ෂණ කාල සීමාව වන විට මැදගම සහ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල 60% කට ආසන්න ප්‍රතිශතයක් බාහිර පන්ති වලට සහභාගී වන බව වාර්තා වී තිබේ. ඒ අනුව පෙනී යන කරුණක් වන්නේ සැලකියයුතු ඉහළ ප්‍රතිශතයක් බාහිර පන්ති වලට සහභාගී වන බවත්, එම තත්වයට බොහෝ විට අදාළ ප්‍රාදේශීය බලප්‍රදේශ වල පාසල්වල පවතින අධ්‍යාපනයේ ගුණාත්මක බව අඩු වීම ද හේතුවක්ව පවතින බවය.

විශේෂයෙන් ම අදාළ සුදුසුකම් ලත් ගුරුවරු නොමැතිකම මෙන්ම සාමාන්‍යයෙන් පාසලේ පවතින ගුරු හිඟයත් මේ සඳහා හේතු වී තිබේ. බාහිර පන්ති සඳහා සහභාගී වීමට හේතු වශයෙන් දරුවන් විසින් දක්වන ලද හේතු වූයේ අතිරේක දැනුම ලබා ගැනීමත්, පාසලේදී විෂය නිර්දේශයන් නිසි පරිදි ආවරණය නොවීමත්, පාසලේ දී උගන්වන පාඩම අවබෝධයේ පවතින අපහසු බව, ගුරුවරු විසින් සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකිරීම යන හේතු නිසා බාහිර පන්ති වලට සහභාගී වීමට සිදුවන බවයි. එමෙන්ම තම මිතුරන් බාහිර පන්ති වලට සහභාගී වන නිසා, තමන්ද සහභාගී වන බව ඇතැම් සිසුන්ගේ මතය යි.


## 2.3 පහසුකම්

**5, 6, 7 රූප සටහන්** මගින් බඩල්කුඹුර, මඩුල්ල හා මැදගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගේ ද්විතීයික අධ්‍යාපනය ලබන දරුවන්ට පවතින පහසුකම් වල තත්වය පිළිබඳව ඉදිරිපත් කරයි.


සමීක්ෂණ දත්ත අනුව සලකා බලන ලද සියලුම පහසුකම් අධ්‍යයන ප්‍රදේශය තුළ සැලකියයුතු සිසු ප්‍රතිශතයක් වෙත පවතින බව වාර්තා වන අතර, නමුත් සැලකියයුතු වෙනස්කම් දිවා ආහාරය සැපයීම, මුළුතැන්ගෙය පහසුකම්, ප්‍රමාණවත් ගුරුවරු සහ සුරක්ෂා රක්ෂණය ආදී පහසුකම් සම්බන්ධයෙන් කොට්ඨාශයන් තුනෙන්ම හඳුනාගත හැකිය.

එමෙන් ම "සුරක්ෂා" රක්ෂණය පසුගිය මාස 4 තුළ 70% පමණ ප්‍රතිශතයක් ඉහල යාමක් දෙවන සමීක්ෂණ කාල සීමාව තුල දක්නට ලැබේ. සාමාන්‍යයෙන් සුරක්ෂා රක්ෂණ පහසුකම ශ්‍රී ලංකාවේ සියලුම පාසල් සිසුන් සඳහා සැපයෙන පහසුකමක් වේ. සමහර ප්‍රතිචාර වලට අනුව සුරක්ෂා පහසුකම නොමැති බවට දක්වන ප්‍රතිචාර මගින් පෙන්නුම් කරන්නේ එම පහසුකම පිළිබඳව ඔවුන් තුළ පවතින අනවබෝධයයි. කෙසේ වෙතත් මෙම පහසුකම පිළිබඳව පවතින අවබෝධයේ සැලකියයුතු ඉහළ යාමක් දෙවන සමීක්ෂණයෙන් පෙන්නුම් කරයි. එම හේතුව නිසා සුරක්ෂා රක්ෂණය පිළිබඳව වන අවබෝධය හා දැනුවත් බව තව දුරටත් වර්ධනය කිරීමේ අවශ්‍යතාවක් ඉස්මතුවන අතර විශේෂයෙන් ම අඩු පහසුකම් පවතින ප්‍රදේශ වල පාසල් දරුවන්ට එය වඩා ප්‍රතිඵලදායි වනු ඇත.


**5 වැනි රූප සටහන : බඩල්කුඹුර කොට්ඨාශය තුළ පහසුකම් පැවතීම හා භාවිතය**



**6 වැනි රූප සටහන : මැදගම කොට්ඨාශය තුළ පහසුකම් පැවතීම හා භාවිතය**




**7 වැනි රූප සටහන : මඩුල්ල කොට්ඨාශය තුළ පහසුකම් පැවතීම හා භාවිතය**




පාසල්වල ගුරුවරුන් අවශ්‍ය ප්‍රමාණයට සිටීමේ තත්වයෙහි තරමක අඩු වීමක් බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වාර්තා වන අතර සාපේක්ෂව මඩුල්ල සහ මැදගම පාසල්වල ගුරුවරු ප්‍රමාණයේ ඉහළ යාමක් දක්නට ලැබේ. එහෙත් තව දුරටත් එම ප්‍රදේශ වල පාසල් වල ගුරුවරුන්ගේ අවශ්‍යතාවයක් පවතින බව වාර්තා වේ. දිවා ආහාරය සම්බන්ධයෙන් සලකා බැලීමේදී ප්‍රාථමික පාසල් සිසුන්ට හෝ සිසුන් 100ට වඩා අඩු සංඛ්‍යාවක් සිටින පාසල්වලට දිවා ආහාරය ලබා දීමේ අවශ්‍යතාවක් පවතී. ද්විතීය පාසල් සිසුන්ට මෙම පහසුකම ලබා දීම අනිවාර්ය නොවන අතර සමීක්ෂණයට ලක් කරන ලද ප්‍රදේශවල මෙම පහසුකම නොපවත්නා බව පිළිබිඹු වන්නේ එම නිසා ය. කෙසේ වුව ද ප්‍රාථමික පාසල්වල ඉගෙනුම ලබන තමන්ගේ බාල සහෝදර සහෝදරියන්ට දිවා


ආහාරය ලැබෙන නිසා තමන්ට ද දිවා ආහාරය ලැබිය යුතු බවට ද්විතීය පාසල් සිසුන් අතර අපේක්ෂාවක් පවතින බව පෙනී යයි.

පාසල් සිසුන්ගෙන් 100%කට ම පාහේ පාසල් පෙළ පොත් සහ නිළ ඇදුම් වවුචර් ලැබෙන බව වාර්තා වී තිබේ. නිළ ඇඳුම් වවුචර් පිළිබඳ විමසීමේදී බොහෝ දෙනෙකු පෙර පැවති නිළ ඇඳුම් සඳහා රෙදි නොව වවුචර ලබා ගැනීමට වැඩි කැමැත්තක් පැවතිණ. සමහර සිසුහු සපත්තු හෝ වෙනත් ඇඳුම් පැලඳුම් වැනි වෙනත් අවශ්‍යතා මිල දී ගැනීම සඳහා වවුචර යොදා ගෙන තිබේ. නිල ඇඳුම් වවුචර නිසා සිදු වන අවාසිය වන්නේ වවුචර යොදා ගනිමින් නිළ ඇඳුම්/ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා සැලකිය යුතු දුරක පවත්නා වාණිජ මධ්‍යස්ථානයකට යාමට සිදු වන ඉතා දුර බැහැර ප්‍රදේශවල සිසුන්ට ඉන් අපහසුතාවක් ඇති විය හැකි වීම යි.

## 2.4 අමතර ගෙවීම්[1]

පුරවැසි වාර්තාපත් සමීක්ෂණයට අනුව තමන්ගේ පාසල්වලට විවිධ ගෙවීම් කිරීමට සිදු වී ඇති නිසා සමහර සිසුන්ට අමතර වියදම් දැරීමට සිදු වී ඇති බව ද පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් අනාවරණය විය. **8 වැනි රූප සටහන** මඟින් පෙන්නුම් කරන පරිදි අදාළ ගෙවීම් බොහෝමයක් මුදල් ලෙස ඉල්ලා සිටින බවත්, ඉතා කුඩා ප්‍රමාණයක් මුදල් නොවන වෙනත් ක්‍රම ලෙස ගෙවීමට සිදුවන බවත් වාර්තා වී තිබේ. සළකා බලන ලද ප්‍රාදේශීය බල ප්‍රදේශයන් තුනෙහිම සිසුන් විසින් පාසලට ගෙවීමට සිදුවන ගෙවීම් දෙවන සමීක්ෂණ කාලයේ දී ඉහල යාමක් පෙන්නුම් කරයි.

**8 වැනි රූප සටහන : පාසල් විසින් ගෙවීම් කරන ලෙස ඉල්ලා සිටිනු ලබන අමතර ගෙවීම්**





බොහෝ අවස්ථා වලදී එම මුදල් සඳහා පාසලෙන් ලදු පත් (රිසිට් පත්) නිකුත් කරන බව සිසුන් විසින් වාර්තා කර තිබෙන අතර සැලකිය යුතු සිසු ප්‍රතිශතයක් විසින් පාසලෙන් රිසිට් පතක් නිකුත් නොකරන බව **9 වැනි රූප සටහන** ඇසුරෙන් වාර්තා කර තිබේ.

දෙවන සමීක්ෂණ කාලය අතරතුර දී ද සිසුන් වෙත අතිරේක ගෙවීම් සඳහා රිසිට් පත් නිකුත් කිරීම දක්නට ලැබුනත්, එය පළමු අවස්ථාවට සාපේක්ෂව තරමක අඩුවීමක් පෙන්නුම් කරයි. ඒ අනුව රිසිට්පතක් නිකුත් නොකරන ලද අවස්ථා වලට අදාළ ගෙවීම් සඳහා රිසිට්පත් නිකුත් කිරීම පිළිබඳව තව දුරටත් අවධානය යොමු කිරීම වැදගත් වන බව පෙනී යයි.

[1] සෘජුව නොපෙනෙන, වියදමක් නොවන එහෙත් වක්‍රාකාරයෙන් කළයුතු වියදම්


**9 වැනි රූප සටහන : පාසල්වලට කරන අමතර ගෙවීම් සඳහා ලදු පත් නිකුත් කිරීම**




## 2.5 වෙනත් අපහසුතා

සමීක්ෂණයට ලක් කරන ලද ඇතැම් සිසුන් දක්වා තිබෙන පරිදි ඔවුන් පාසලේදී දඬුවම් පැමිණවීම් ආශ්‍රිත ගැටලුවලට මුහුණ දෙන බව **10 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරයි.


**10 වැනි රූප සටහන : පාසල් තුළ පවත්නා දඬුවම් පැමිණවීම ආශ්‍රිත ගැටලු**




දෙවන සමීක්ෂණ කාල සීමාවේදී, සළකා බලන ලද ප්‍රාදේශීය බල ප්‍රදේශයන් වල දරුවන්ට දඬුවම් කිරීම ආශ්‍රිතව වාර්තා වී තිබෙන සිද්ධීන් වල තරමක අඩු වීමක් පෙන්නුම් කරයි. **11 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරන පරිදි වේවැලෙන් පහර දීම ආශ්‍රිත දඬුවම් වල සැලකියයුතු අඩුවීමක් දෙවන සමීක්ෂණ කාලයේදී, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් තුනෙන්ම වාර්තා වේ.


පාසල්වල දී ශාරීරික දඬුවම් පැමිණවීම ශ්‍රී ලංකාව තුළ තහනම් කරනු ලැබ ඇති නමුත්, කෙසේ වෙතත් සිසුන්ට ලබා දෙන දඬුවම් අතර වේවැලෙන් පහරදීම මෙම ප්‍රාදේශීය බල ප්‍රදේශ තුනෙහිම කිසියම් සැලකියයුතු මට්ටමක දක්නට ලැබේ.

**11 වැනි රූප සටහන : සිසුන්ට ලබා දෙන දඬුවම් වර්ග**





**12 වැනි රූප සටහන** සහ **13 වැනි රූප සටහන** මගින් පෙන්නුම් කරනු ලබන්නේ පාසලේ දී සිදුවන නොසළකාහැරීම් (අසමාන ලෙස සැලකීම්) සහ අපයෝජන (කායික, මානසික සහ වාචික ) සිදුවීම් සම්බන්ධවයි. වාර්තා වී ඇත්තේ සිදුවීම් ඉතා සුළු සංඛ්‍යාවක් වුව ද අපයෝජනය හා අසමාන ලෙස සැලකීම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් විය හැකි නිසා බලධාරීන් මෙම සිදුවීම් කෙරෙහි අවධානය යොමු කිරීම යොමු කිරීම අත්‍යාවශ්‍යය කරුණකි.

**12 වැනි රූප සටහන : පාසල් තුළ දී අසමාන ලෙස සැලකීම් සිදු වී ඇති අවස්ථා**




**13 වැනි රූප සටහන : පාසල් තුළ දී අපයෝජන සිදු වී ඇති අවස්ථා**




ගුරුවරුන් සම්බන්ධ ගැටලු අධ්‍යාපනයේ ගුණාත්මක බව කෙරෙහි බලපෑ හැකි ය. විශේෂයෙන් සිසුන් විසින් සලකා බලන ලද කොට්ඨාශ තුනටම අදාළ ගුරුවරුන් සම්බන්ධ ගැටලු ද වාර්තා කරන ලදී. (**14 රූප සටහන** බලන්න). ගුරු හිඟය යන්න තව දුරටත් ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගැටළුවක් බවට පත්ව තිබෙන අවදියක පවා ගුරුවරු සම්බන්ධව පවතින ගැටලු වල සාපේක්ෂව අඩු වීමක් දෙවන සමීක්ෂණ කාල සීමාවේදී මඩුල්ල ප්‍රදේශයේ හඳුනා ගත හැකි අතර මැදගම හා බඩල්කුඹුර යන ප්‍රදේශයන්හි ගුරුවරුන් සම්බන්ධ ගැටළු ඉහළ යාමක් පෙන්නුම් කරයි. ගුරුවරු සඳහා පවතින පහසුකම් අඩුකම ගුරුවරුන්ට මෙම පාසල්වල වැඩ කටයුතු කිරීම සඳහා පවතින ප්‍රධානතම ගැටළුවක් බවට පත් ව තිබෙන අතර සමීක්ෂණයට තොරතුරු ඉදිරිපත් කරන ලද බොහෝ දෙනෙකුගේ මතය වුයේ මෙම ගැටළුව මගහරවා ගැනීම සඳහා ගුරු නිවාස අවශ්‍ය පරිදි ඉදි කිරීම සුදුසු වන බවය. මේ සඳහා ප්‍රතිචාර දැක්වුවන් ඉදිරිපත් කරන ලද යෝජනාව වුයේ ගුරුවරු පාසල් වලට පත් කිරීමේදී ඉතා දුර බැහැර ගුරුවරුන්ට වඩා පාසලට ආසන්නව වෙසෙන ගුරුවරු පාසලට අනියුක්ත කිරීම සුදුසු බවයි.

**14 වැන රූප සටහන : ගුරුවරුන් සම්බන්ධ ගැටලු**



# 3. ද්විතීය අධ්‍යාපන සේවාවන් සඳහා ලබා දුන් සමස්ත ලකුණු ප්‍රමාණය

**15 වැනි රූප සටහන** අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල, මැදගම හා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයේ කාර්ය සාධනය සඳහා ලබා දෙන ලද ලකුණු ප්‍රමාණය දක්වයි. ලකුණු ලබා දෙන්නේ ද්විතීය අධ්‍යාපන සේවාවන් පිළිබඳව බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ ප්‍රතිශත පදනම් කර ගනිමිනි.

උදාහරණයක් ලෙස වර්ණ සංකේතවලින් පහත දැක්වෙන තත්ත්වය ඇඟවේ:

| වර්ණය | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ % | ගත යුතු පියවර |
|---|---|---|
| (රතු) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| (කහ) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| (කොළ) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

* සේවා පාරිභෝජකයන්ගේ තෘප්තිමත් මට්ටම සැලකීමේ දී ඉතා ඉහළ තෘප්ති මට්ටම සහ සාමාන්‍ය තෘප්ති මට්ටම යන දෙකම සැළකිල්ලට ගෙන ඇත.

**15 වැනි රූප සටහන** මඟින් පෙන්නුම් කරන පරිදි ද්විතීය අධ්‍යාපනය සැපයීමට අදාළ වන බොහෝ සේවා සැපයීමට අදාළ තෘප්ති මට්ටම දෙවන සමීක්ෂණ කාල සීමාවේදී කොළපාටින් වර්ණ ගන්වා තිබේ. ඇතැම් සේවා වල තෘප්ති මට්ටම සැලකියයුතු ලෙස ඉහල ගොස් ඇත. (එම තත්වය ඉහළට දක්වන ලද ඊතල සලකුණ ඇසුරෙන් හඳුනාගත හැකිය). කෙසේ වෙතත් කලාප අධ්‍යාපන කාර්යාල වෙතින් තව දුරටත් අවධානය යොමුකළ යුතු හා සංවර්ධනය විය යුතු සේවා මෙන්ම අංශයන් විශාල ප්‍රමාණයක් පවතින බව හඳුනාගත හැකිය.

15 වැන රූප සටහන : සේවා සම්පාදනය පිළිබඳ සමස්ත ශ්‍රේණිගත කිරීම්

| | පානීය ජලය | වැසිකිළි පහසුකම් | ක්‍රීඩා පිටිය | පාසැල් වැට | පුස්තකාලය | විද්‍යාගාර | පරිගණක විද්‍යාගාර | ආපන ශාලාව | දිවා ආහාරය | මුළුතැන්ගෙය | පෙළ පොත් | නිළ ඇඳුම් රෙදි | ගුරුවරු | සුරක්ෂා රක්ෂණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දෙවන සමීක්ෂණය** | | | | | | | | | | | | | | |
| බඩල්කුඹුර | 83% ↑ | 83% ↓ | 74% ↓ | 57% ↓ | 88% ↓ | 80% ↓ | 74% ↓ | 57% ↓ | 44% ↓ | 60% ↓ | 95% ↑ | 95% ↑ | 94% ↓ | 89% = |
| මැදගම | 76% ↓ | 74% ↓ | 71% ↑ | 68% ↓ | 84% ↓ | 89% = | 81% ↓ | 0% ↓ | 10% ↓ | 44% ↓ | 91% ↓ | 96% ↓ | 87% ↓ | 99% ↑ |
| මඩුල්ල | 89% ↓ | 88% ↓ | 68% ↓ | 76% ↓ | 80% ↓ | 83% ↓ | 77% ↓ | 64% ↑ | 0% ↓ | 87% ↑ | 91% ↑ | 92% ↓ | 95% ↑ | 65% ↓ |
| **පළමු සමීක්ෂණය** | | | | | | | | | | | | | | |
| බඩල්කුඹුර | 79% | 90% | 94% | 89% | 91% | 93% | 80% | 45% | 98% | 95% | 92% | 93% | 99% | 89% |
| මැදගම | 85% | 86% | 70% | 87% | 93% | 89% | 84% | 44% | 99% | 72% | 96% | 99% | 94% | 89% |
| මඩුල්ල | 93% | 91% | 88% | 87% | 97% | 93% | 87% | 62% | 29% | 86% | 90% | 96% | 93% | 98% |

රූප සටහන : ද්විතීය අධ්‍යාපන

| | |
|---|---|
| (රතු) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%ට වඩා අඩු |
| (කහ) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 40%-60% අතර |
| (කොළ) | බෙහෙවින් තෘප්තිමත් ප්‍රතිචාර දක්වන්නන් 60%ට වඩා වැඩි |

# 4. නිර්දේශ


## 4.1 වැඩි දියුණු කළ යුතු සේවා අංශ

### 4.1.1 වහා ම අවධානය යොමු කළ යුතු අංශ


පුරවැසි වාර්තාපත් සමීක්ෂණය මඟින් ඉතා ඉකමනින් සංවර්ධනය සඳහා අවධානය යොමුකළ යුතු අංශයන් පිළිබඳවද අවධානය යොමු කරන ලදී. ඒ අනුව **16, 17 හා 18 වැනි රූප සටහන්** මඟින් පෙන්නුම් කරන්නේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ තව දුරටත් සංවර්ධනය විය යුතු අංශයන් හා පහසුකම් පිළිබඳවය.

බඩල්කුඹුර සහ මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් වල මූලිකවම ඉතා ඉක්මනින් සංවර්ධනයට අවධානය යොමු කළ යුතු අංශ බවට පත් වන්නේ ක්‍රීඩාංගන හා ඒ ආශ්‍රිත පහසුකම්, පාසල් ගොඩනැගිලි සහ අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් යන අංශයන් ය. මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් අතුරෙන් මූලිකවම සංවර්ධනය කිරීමට මූලිකත්වය දිය යුතු අංශ වන්නේ ක්‍රීඩා පිට්ටනි සහ පහසුකම්, පාසල් ගොඩනැගිලි සහ පහසුකම් මෙන්ම විද්‍යාගාර, පරිගණක විද්‍යාගාර පහසුකම් ආශ්‍රිත පහසුකම් ය.


**16 වැනි රූප සටහන : බඩල්කුඹුර කොට්ඨාශය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ**



17 වැනි රූප සටහන : මැදගම කොට්ඨාශය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ




18 වැනි රූප සටහන : මඩුල්ල කොට්ඨාශය තුළ පවත්නා වහා ම පියවර ගත යුතු අංශ



### 4.1.2 සේවා වැඩි දියුණුව සඳහා වන යෝජනා

පිළිතුරු සපයන ලද පිරිස් විසින් හඳුනා ගන්නා ලද පරිදි ද්විතීයික අධ්‍යාපනය සේවා සම්බන්ධයෙන් වන අඩු තෘප්තිමත්බව කෙරෙහි හේතු විශාල ප්‍රමාණයක් දැක්විය හැකිය. අවශ්‍ය පහසුකම් හිඟකම, අදාළ පහසුකම් නිසි පරිදි නඩත්තු නොකිරීම, අදාළ ආයතන විසින් නිසි පරිදි කරුණු සෙවීමට දක්වන මැලිකම ආදිය දැක්විය හැකිය.

ප්‍රතිචාර දක්වන්නන් විසින් යෝජනා කර තිබෙන පරිදි ද්විතීයික අධ්‍යාපනය සේවා සංවර්ධනය සඳහා අදාළ අංශයන්ගේ නිසි ක්‍රියාකාරිත්වය සහ අවධානය යොමු වීම වැදගත් වේ. එමෙන්ම දරුවන් සඳහා පාසැලින් සිදුවන නොසලකාහැරීම සහ ඒ ආශ්‍රිත ගැටළු වලින් අරක්ෂා කිරීමත් වැදගත් වනු ඇත. සේවා පරිභෝජකයන් විසින් දක්වන ලද ප්‍රතිචාර අතර මීළග අදහස වන්නේ සේවාවන්ගේ ගුණාත්මක බව පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා මේ වැනි අධ්‍යයනයක් වසරකට වරක් වත් කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සිදු කිරීම තුළින් අදාළ වෙනස්කම් මනාව හඳුනාගත හැකි බවයි.

### 4.1.3 වෙනත් සලකා බැලීම්

මෙම අධ්‍යයනයේ දත්තවලට ද්විතීය අධ්‍යාපන අංශය තුළ ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් සැලසුම් කිරීම සඳහා සුදුසු අවම මට්ටමක් (විශේෂයෙන් ම **15 වැනි රූප සටහන** තුළ දක්වා ඇති ලකුණු ප්‍රමාණය) සම්පාදනය කළ හැකි ය.

සේවා සැපයීම සම්බන්ධයෙන් පවතින අඩුපාඩු සහ ගැටලුකාරී තත්වයන් මෙම අධ්‍යයනය ඇසුරෙන් ඉස්මතු කෙරෙන අතර එම තත්වයන් විසදීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සෙවීම අත්‍යාවශ්‍ය ය. මෙම ඉක්මන් අවධානය යොමු කළ යුතු අංශයන් අනාගතයේ ද්විතීයික අධ්‍යාපනය පිළිබඳව කොට්ඨාශයන් මට්ටමෙන් සැලසුම් සම්පාදනය කිරීමේදී වැඩි අවදානයක් යොමු කිරීම වැදගත් වනු ඇත.

## 4.2 ඉදිරි මාවත

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ දෙවන වටයට පෙර සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා කෙටි කාලීන හා දීර්ඝ කාලීන අරමුණු හඳුනා ගනිමින් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිණිස සේවා සම්පාදකයන් සහ සේවාලාභීන් අතර සාකච්ඡාවලට පහසුකම් සපයන ලදි. මුලතිවු ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනයට අදාළ ක්‍රියාකාරී සැලසුම් 1 ඇමුණුමේ දක්වා ඇත.

2018 වසරේ මැයි මාසයේ දී පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණ මූලික සොයාගැනීම් පදනම් කරගෙන ක්‍රියාකාරී සැලසුම් සකස් කරනු ලැබිණ. මෙම සොයාගැනීම් පළාත් පාලන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, රජයේ අධ්‍යාපන පලාත්පාලන හා ප්‍රාදේශීය සභා ලේකම් වරුන්ටත් ප්‍රජා සාමාජිකයින්ටත් ඉදිරිපත් කරනු ලැබුවේ එම මූලික සොයා ගැනීම් ඉදිරිපත් කිරීම් වැඩසටහන් තුළිණි.

සේවා සපයන්නන් සහ සේවා භාවිත කරන්නන් යන කණ්ඩායම් අතර පවත්වන ලද සාකච්ඡා පදනම් කරගෙන මෙම ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කරන ලද අතර ඒ අනුව කෙටි කාලීනව හා දිගු කාලීනව වන සැලසුම් 2018 වසරේ ඔක්තෝම්බර් මාසයේ පැවැත්වෙන දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණයට පෙර සංවර්ධනය කළහැකි ඉලක්ක බවට පත් විය. විශේෂයෙන්ම මෙම ක්‍රියාකාරී සැලසුම් සිවිල් සංවිධාන නියෝජිතයන්ට සේවා ප්‍රගතිය පිළිබඳව සොයා බැලීමට උපකාරී විය.

දෙවන පුරවැසි වාර්තාපත් සමීක්ෂණය සිදු කරනු ලැබුයේ 2018 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී ය. එහිදී පළමු සමීක්ෂණය ඇසුරෙන් හඳුනාගනු ලැබූ සහ අගය කරන ලද සේවාවන්ගේ ප්‍රගතිය විමසා බැලීම අපේක්ෂා කරන ලදී. පහත දැක්වෙන වර්ණ වෙනස්වීම් සටහන සේවාවන්ගේ තෘප්ති මට්ටම් වෙනස්වීම සහ අවධානය යොමුකළ යුතු අංශ පිළිබඳව විග්‍රහයක් සපයයි.

**15 වැනි රූප සටහන** මගින් **පළමු සමීක්ෂණය (පළමු)** සහ **දෙවන සමීක්ෂණය (දෙවන)** අතර වන සංසන්ධනාත්මක විග්‍රහයක් දක්වයි. වර්ණ වෙනස්වීම මගින් පෙන්නුම් කරන්නේ පසුගිය මාස හතරක කාලසීමාව තුල අදාළ සේවාව පිළිබඳ තෘප්ති මට්ටමේ සිදු වූ වෙනස් විමයි.

| වර්ණය | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන්ගේ % | ගත යුතු පියවර |
|---|---|---|
| (රතු) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%ට වඩා අඩු | වහා ම අවධානය යොමු කළ යුතු ය |
| (කහ) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 40%-60% අතර | වැඩි දියුණු කළ යුතු ය |
| (කොළ) | බෙහෙවින් තෘප්තිමත් පරිහරණය කරන්නන් 60%ට වඩා වැඩි | කාර්ය සාධනය අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු අතර වැඩි දියුණු කිරීම් අඛණ්ඩව කර ගෙන යා හැකි නම් වඩාත් හොඳ ය |

* සේවා පාරිභෝජකයන්ගේ තෘප්තිමත් මට්ටම සැලකීමේ දී ඉතා ඉහළ තෘප්ති මට්ටම සහ සාමාන්‍ය තෘප්ති මට්ටම යන දෙකම සැළකිල්ලට ගෙන ඇත.

විශේෂයෙන්ම අදාළ සේවාවේ තෘප්ති මට්ටමට අයත් වර්ණය වෙනස් වීම අනිවාර්ය සාධකයක් ලෙස මෙහිදී හඳුනා ගැනීම අත්‍යාවශ්‍ය නොවන අතර, සේවාවට අදාළ වන ප්‍රතිශතකමය වෙනස්කම අදාළ සේවාවේ ප්‍රගතිය පෙන්වන දර්ශකයක් ලෙස යොදාගත හැකිය.

තෘප්ති මට්ටම ඉහළ යාම සඳහා පළමු පුරවැසි වාර්තාපත් සමීක්ෂණයෙන් එම සොයා ගැනීම සහ ඒ පිළිබඳව සේවා සම්පාදකයන් අතර ඇති වූ දැනුවත්භාවය මෙන්ම සේවාවන්ගේ ගුණාත්මක බව වර්ධනය කිරීම පිළිබඳව ඇති වූ කථිකාව කිසියම් සාධනීය බලපෑමක් කර තිබේ. එමෙන්ම මෙම ක්‍රියාවලිය සේවා සම්පාදකයන් හට අදාළ ප්‍රදේශයන් වෙත සැපයෙන සේවාවන් සංවර්ධනය කිරීමටත්, ඒ අනුව සේවා පරිභෝජකයන් අතර තෘප්ති මට්ටම ඉහළ නැංවීමටත් උපකාරී වී තිබේ.

එම නිසා ප්‍රගතිය විමසා බැලෙන **15 වැනි රූප සටහන** අනුව පෙන්නුම් කරන ප්‍රතිඵල රාශියකි. එමගින් සේවා භාවිත කරන්නන් වෙත තමන් භාවිත කරන සේවාව පිළිබඳව තෘප්ති මට්ටමත්, අදාළ සේවා පිළිබඳ සේවා සම්පාදකයන්ගේ ක්‍රියාකාරිත්වයත්, සේවාවන්ගේ ගුණාත්මක බව පිළිබඳවත් සන්නිවේදනය කරයි. එමෙන්ම එය මහජන නියෝජිතයන්ට, පළමු සමීක්ෂණ කාලයත් දෙවන සමීක්ෂණ කාලයත් තුළ තමන්ගේ ඡන්ද බල ප්‍රදේශ වල සේවාවන්ගේ ගුණාත්මක බව වෙනස්වීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනිමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයටත් වැදගත් වේ.

විද්‍යුත් පුරවැසි වාර්තාපතේ සොයා ගැනීම් යනු ප්‍රජා ප්‍රතිචාර පදනම් කර ගත් දර්ශකයන් නොහොත් මාර්ගෝපදේශයන් බවත් ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය පිළිබඳ වඩාත් සංකීර්ණ ගැටලු පැවතිය හැකි අංශ ඒවායින් පෙන්නුම් කෙරෙන බවත් සිත තබා ගනිමින් ගැටලු පවත්නා අංශ තව දුරටත් විමර්ශනය කිරීම සඳහා මෙම විද්‍යුත් පුරවැසි වාර්තාපතෙන් සම්පාදනය වන තොරතුරු යොදා ගත හැකි ය. මෙම ගැටලුවලට තුඩු දෙන හේතු අවබෝධ කර ගැනීම සඳහා වඩාත් පුළුල් හා ගැඹුරු විමසා බැලීමක් හා අධ්‍යයනයක් වුව ද සිදු කළ හැකි ය.

ඉලක්ක පියවරයන්ට මුල පිරීම සඳහා පහත දැක්වෙන පියවරයන් නිර්දේශ කළ හැකි ය:

- විද්‍යුත් පුරවැසි වාර්තාපතේ ශ්‍රේණිගත කිරීම් පදනම් කර ගෙන සේවා කාර්ය සාධනය සම්බන්ධයෙන් විශේෂ දුර්වලතාවක් පෙන්නුම් කරන අංශ හඳුනා ගත හැකි ය,
- සේවාවන් වැඩි දියුණු කිරීම පිණිස සපුරාලීමට සිදු විය හැකි අඩුපාඩුකම් හඳුනා ගනිමින් ඵලදායක අධ්‍යාපන සේවා සම්පාදනයට බාධා කරන මූලික හේතු සාධක කවරේ දැයි විමසා බලන්න,
- අධ්‍යාපන සේවා සම්පාදනයේ අඩුපාඩුකම් මග හැරවීම සඳහා එකවර මැදිහත් වීම් ගණනාවක් කිරීමට සිදු විය හැකි ය,
- සේවා සම්පාදනය සම්බන්ධයෙන් පවත්නා අඩුපාඩුකම් මග හැරවූ පසු සේවාවන් පරිහරණය කරන්නන්ගේ තෘප්තියේ මට්ටම් පිළිබඳව පසු විපරමක යෙදීමටත් සේවා කාර්ය සාධනය අවම මට්ටම්වලින් ඉහළ මට්ටම් වැඩි දියුණු වී ඇත්දැයි තීරණය කිරීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

ඇමුණුම 1: ක්‍රියාකාරී වැඩ සැලැස්ම

පුරවැසි වාර්තාපත් සමීක්ෂණය - ක්‍රියාකාරී වැඩ සැලැස්ම - මැදගම අධ්‍යාපන කොට්ඨාශය

ආවරණය වන වසම් - රත්තණදෙණිය, බැදියාව, කොටබෝව, මැල්ලගම, බිබිලමුල්ල, ඇල්හේන, පිටදෙණිය

| අනුක්‍රමික අංක | මූලිකත්වය දියුතු සේවාව | කෙටිකාලීන/ දිගුකාලීන | වගකීම දරන්නේ කව්ද යන වග | සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ | ආරම්භක දිනය | අවසන් දිනය | නිරීක්ෂණය/ මෙහෙයවීම | මාසික හමුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | පානීය ජලය | දිගුකාලීන | ග්‍රාමීය සිවිල් ප්‍රජා සංවිධාන, පාසල් සංවර්ධන සමිතිය, රාජ්‍ය සංවිධාන වල නිලධාරීන් සහ ප්‍රජා සංවිධාන නිලධාරීන් | රාජ්‍ය සංවිධාන වල නිලධාරීන් හා ප්‍රජා සංවිධාන නිලධාරීන් | අගෝස්තු මාසය තුළ | 2019 ඔක්තෝම්බර් | ග්‍රාම නිලධාරී, විදුහල්පති, සෞඛ්‍ය පරීක්ෂක, කලාප කාර්යාලය | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 2 | වැසිකිලි පහසුකම් නඩත්තු කිරීම | කෙටිකාලීන | ග්‍රාමීය සිවිල් ප්‍රජා සංවිධාන සහ පාසල් සංවර්ධන සමිතිය | දෙමාපියන්, විදුහල්පතිතුමා හා සමුර්ධි බලකාය | සුළු අලුත්වැඩියා කිරීම්<br>2018 මැයි අවසන් සතිය සිට 2018 ජුනි දක්වා | 2018 අගෝස්තු<br><br>2018 දෙසැම්බර් | විදුහල්පතිතුමා, කලාප කාර්යාලය | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 3 | ආරක්ෂිත වැට (තාප්පය) | දිගුකාලීන | කලාප කාර්යාලය හා විදුහල්පතිතුමා | කලාප කාර්යාලය විදුහල්පතිතුමා පාසැල් සංවර්ධන සමිතිය | 2018 වර්ෂය ඇතුලත | 2020 වසර | කලාප කාර්යාලය විදුහල්පතිතුමා,<br><br>පාසැල් සංවර්ධන සමිතිය | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 4 | ගුරු ගැටළුව | කෙටිකාලීන | විදුහල්පතිතුමා | විදුහල්පතිතුමා, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කලාප කාර්යාලය | 2018 ජුනි | 2018 සැප්තැම්බර් | කලාප කාර්යාලය | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 5 | ක්‍රීඩා පිට්ටනිය | දිගුකාලීන | විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩල | පාසල් සංවර්ධන සමිතිය, ප්‍රාදේශීය සභාව<br><br>ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 ජුනි | 2018 වසර | කලාප කාර්යාලය | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |

| අනුක්‍රමික අංක | මූලිකත්වය දියුතු සේවාව | කෙටිකාලීන/ දිගුකාලීන | වගකීම දරන්නේ කව්ද යන වග | සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ | ආරම්භක දිනය | අවසන් දිනය | නිරීක්ෂණය/ මෙහෙයවීම | මාසික හමුව |
|---|---|---|---|---|---|---|---|---|
| 6 | ආපන ශාලාව | කෙටිකාලීන | විදුහල්පතිතුමා, පාසල් පෝෂණ කමිටුව | (ප්‍රමිතියෙන් යුතුව ආපන ශාලාව පවත්වාගෙන යාම) විදුහල්පතිතුමා, පාසැල් සංවර්ධන සමිතිය ප්‍රජාව | 2018 මැයි | 2018 ජුනි | කලාප කාර්යාලය, විදුහල්පතිතුමා, මහජන සෞඛ්‍ය පරීක්ෂක | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 7 | සුරක්ෂා රක්ෂණය | කෙටිකාලීන | විදුහල්පති තුමා | ගුරු මණ්ඩලය, දෙමාපියන් හා දරුවන් | 2018 මැයි | 2018 ජුනි | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |
| 8 | පාසලේ ගොඩනැගිලි | දිගුකාලීන | විදුහල්පතිතුමා, ගුරු මණ්ඩලය, පාසල් සංවර්ධන සමිතිය දෙමාපියන් හා විදුහල්පති තුමා | දෙමාපියන් හා විදුහල්පති තුමා | 2018 ජුනි | 2018 වසර | කලාප කාර්යාලය | මාසයේ තුන්වන සතියේ සිකුරාදා |

**සැකසුම -**

ටී.එම්. ධර්මදාස, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ - මැදගම කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, මැදගම
පද්මිනි නෙරංජලා - රත්තණදෙණිය
වසන්ති සංජීවනී - රත්තණදෙණිය
චන්දිමා ජීවන්ති - බැදියාව
ගයානි මධුවන්ති - පිටදෙණිය
චමෝදි උපේශිකා - පිටදෙණිය

**දිනය (2018-05-10), ස්ථානය - සහකාර පලාත්පාලන කොමසාරිස් කාර්යාලය, මොණරාගල**

## පුරවැසි වාර්තාපත් සමීක්ෂණය - ක්‍රියාකාරී වැඩ සැලැස්ම - මඩුල්ල අධ්‍යාපන කොට්ඨාශය

### ආවරණය වන වසම් - නාමල් ඔය ජනපදය, පගුර, කොල්ලදෙණිය, රිටිගහවත්ත, පංගුව, තල්කොටයාය, මාගන්දාඹය ජනපදය

| අනුක්‍රමික අංක | මූලිකත්වය දියුතු සේවාව | කෙටිකාලීන/ දිගුකාලීන | වගකීම දරන්නේ කව්ද යන වග | සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ | ආරම්භක දිනය | අවසන් දිනය | නිරීක්ෂණය/ මෙහෙයවීම | මාසික හමුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගුරු පහසුකම් | කෙටිකාලීන හා දිගුකාලීන | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා | කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ, විදුහල්පති, ගුරුවරු | 2018 මැයි 10 | 2018-8-10 | සිවිල් සමාජ සංවිධාන | මාස තුනකට වරක් සිකුරාදා |
| 2 | පානීය ජලය ලබාදීම<br>පිරිපහදු කිරීම | කෙටිකාලීන හා දිගුකාලීන | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභාව, රාජ්‍ය නොවන සංවිධාන | පාසල් සංවර්ධන සමිතිය | 2018 මැයි 10 | 2020 වසර | සිවිල් සමාජ සංවිධාන | මාස තුනකට වරක් |
| 3 | වැසිකිළි පහසුකම් | දිගුකාලීන | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පළාත් අධ්‍යාපන ආයතනය හා විදුහල්පති | විදුහල්පති | 2018 මැයි 10 | 2020 වසර | විදුහල්පති | මාස තුනකට වරක් |
| 4 | පුස්තකාල | දිගුකාලීන | විදුහල්පති, පුස්තකාලයාධිපති | විදුහල්පති | 2018 මැයි 10 | 2018 ජූලි 10 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා හා පුස්තකාලයාධිපති | මාස තුනකට වරක් |
| 5 | ක්‍රීඩා පිටිය හා පහසුකම් | දිගුකාලීන | දෙමවුපියන්, විදුහල්පති, පාසල් සංවර්ධන කමිටුව | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, පාසල් සංවර්ධන සමිතිය | 2018 මැයි 10 | 2018 අගෝස්තු 10 | කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, විදුහල්පති | මාස තුනකට වරක් |
| 6 | විද්‍යාගාර පහසුකම්, ගුරු හිඟය හා උපකරණ හිඟය | කෙටිකාලීන | පළාත් පාලන අධ්‍යක්ෂ තුමා, කළාප අධ්‍යක්ෂ තුමා, පළාත් පාලන අධ්‍යක්ෂ තුමා | කළාප අධ්‍යක්ෂ තුමා, පළාත් පාලන අධ්‍යක්ෂ තුමා | 2018 මැයි 10 | 2020 වසර<br>2018 අගෝස්තු 10 | විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | මාස තුනකට වරක් |
| 7 | ආපන ශාලාව ප්‍රමිතිය | කෙටිකාලීන | විදුහල්පති, පාසල් පෝෂණ කමිටුව, මහජන පරීක්ෂක තුමා | විදුහල්පති, පාසල් පෝෂණ කමිටුව, මහජන පරීක්ෂක තුමා | 2018 මැයි 10 | 2018 අගෝස්තු 10 | විදුහල්පති | මාස තුනකට වරක් |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 8 | නිළ ඇඳුම් | දිගුකාලීන | කලාප අධ්‍යාපන කාර්යාලය | කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 මැයි 10 | 2018 අගෝස්තු 10 | විදුහල්පති | මාස තුනකට වරක් |
| 9 | පෙළ පොත් | දිගුකාලීන | ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය | ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 මැයි 10 | 2020 වසර | විදුහල්පති, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ | මාස තුනකට වරක් |

**සැකසුම**

පී.කේ.අයි. සමාල - සහකාර කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ, බිබිල
කේ. ඩී.පී නාලිකා කරුණාතිලක - කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, මඩුල්ල
එච්.එම්. චන්ද්‍රිකා හේරත් - නාමල්ඔය ජනපදය, ග්‍රාමීය සංවිධානය
එන්. චම්පිකා දමයන්ත - නාමල්ඔය ජනපදය, ග්‍රාමීය සංවිධානය
කේ.එම්. චන්ද්‍රපාල - රිටිගහවත්ත
කේ.එම්. පුෂ්පා කුමාරි - රිටිගහවත්ත
ජී.ජී. පියල් බන්දුල - කොල්ලදෙණිය
ආර් එම්. සමන්සිරි - මාගන්දාඔය ජනපදය
කේ.එම්. ජයතිලක - පංගුව, දඹගල්ල

**දිනය (2018-05-10), ස්ථානය - සහකාර පලාත්පාලන කොමසාරිස් කාර්යාලය, මොණරාගල**

## පුරවැසි වාර්තාපත් සමීක්ෂණය - ක්‍රියාකාරී වැඩ සැලැස්ම - බඩල්කුඹුර කොට්ඨාසය, මොණරාගල කලාපය

**ආවරණය වන වසම් - කොටමුදුන, දේවතුර, මියෙනකඳුර, ඇල්ල, මාළිගාතැන්න, ලුණුගල ජනපදය**

| අනුක්‍රමික අංක | මූලිකත්වය දියුතු සේවාව | කෙටිකාලීන/ දිගුකාලීන | වගකීම දරන්නේ කවුද යන වග | සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ | ආරම්භක දිනය | අවසන් දිනය | නිරීක්ෂණය/ මෙහෙයවීම | මාසික හමුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | කෙටිකාලීන | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ බඩල්කුඹුර කොට්ඨාශය, මොණරාගල කලාපය | ගුරුවරු, ප්‍රාථමික ගුරු උපදේශකවරු | 2018 මැයි 10 | 2018 මැයි 30 | සිවිල් සංවිධාන සාමාජිකයන්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය | 2018 ජුනි 20 |
| 2 | පානීය ජල ගැටලුව | දිගුකාලීන | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය, දෙමාපියන්, කලාප කාර්යාලය | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය, දෙමාපියන්, කලාප කාර්යාලය | 2018 මැයි 10 | 2018 දෙසැම්බර් 31 | සිවිල් සංවිධාන සාමාජිකයන්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 සැප්තැම්බර් 30 |
| 3 | ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | දිගුකාලීන | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය, දෙමාපියන්, කලාප කාර්යාලය | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය, දෙමාපියන්, කලාප කාර්යාලය, දේශපාලන නියෝජිතයන් | 2018 මැයි 10 | 2018 දෙසැම්බර් 31 | සිවිල් සංවිධාන සාමාජිකයන්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 සැප්තැම්බර් 30 |
| 4 | සැගවුණු ගාස්තු අඩු කිරීම හා ලදු පත් නිකුත් කිරීම | කෙටිකාලීන | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ බඩල්කුඹුර කොට්ඨාශය, මොණරාගල කලාපය | විදුහල්පති, පාසල් සංවර්ධන සමිතිය, භාණ්ඩාගාරික, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 මැයි 20 | 2018 දෙසැම්බර් 31 | සිවිල් සංවිධාන සාමාජිකයන්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 සැප්තැම්බර් 30 |
| 5 | සිසුන්ට දඬුවම් ලබාදීම පිළිබඳ සොයා බැලීම | කෙටිකාලීන | විදුහල්පති, විනය කමිටුව, පන්තිභාර ගුරුවරු | විදුහල්පති, දෙමාපියන්, බඩල්කුඹුර කොට්ඨාශය, මොණරාගල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා | 2018 මැයි 20 | 2018 ජුනි 31 | විදුහල්පති, සිවිල් සංවිධාන සාමාජිකයන්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 සැප්තැම්බර් 30 |
| 6 | සුරක්ෂා රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම | කෙටිකාලීන | විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | විදුහල්පති, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 ජුනි 1 | 2018 ජුනි 30 | සිවිල් සංවිධාන සාමාජිකයන්, විදුහල්පති, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 ජුනි 15 |

| අනුක්‍රමික අංක | මූලිකත්වය දියුතු සේවාව | කෙටිකාලීන/ දිගුකාලීන | වගකීම දරන්නේ කවිද යන වග | සේවා වැඩි දියුණුවට අවශ්‍ය පාර්ශව කරුවන් හා අංශ | ආරම්භක දිනය | අවසන් දිනය | නිරීක්ෂණය/ මෙහෙයවීම | මාසික හමුව |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | නිල ඇඳුම් වවුචර් ලබාදීම | දිගුකාලීන | අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය | අධ්‍යාපන ඇමතිතුමා, අධ්‍යාපන ලේකම්තුමා, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 ජුනි | 2018 දෙසැම්බර් | අධ්‍යාපන ඇමතිතුමා, අධ්‍යාපන ලේකම්තුමා, කලාප අධ්‍යාපන කාර්යාලය | 2018 සැප්තැම්බර් 30 |

**සැකසුම**
ඩී.සී. ජසින්තා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, බඩල්කුඹුර කොට්ඨාසය, මොණරාගල කලාප අධ්‍යාපන කාර්යාලය,

එම්.ඒ. ධම්මිකා - කොටමුදුන

ආර්.ඩබ්ලිව්. අශෝක විජේසිංහ - ඇල්ල
ඒ.එම්. සුපුන් ප්‍රියංකර - මාළිගාතැන්න
ජේ.එම් සෝමලතා - ලුණුගල ජනපදය
ආර්.එම්. ප්‍රේමතිලක - ලුණුගල ජනපදය

**දිනය (2018-05-10), ස්ථානය - සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය - බඩල්කුඹුර කොට්ඨාසය, මොණරාගල කලාපය**

CEPA ආයතනය, යුරෝපා සංගමය විසින් අරමුදල් සම්පාදිත "සමාජ සංවර්ධනය හා යහපාලනය එකිනෙකට සමගාමීව ඇති කිරීම: වඩාත් හොඳ සමාජ සේවාවන් සම්පාදනය කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රජයේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම" ව්‍යාපෘතිය යටතේ මඩකලපුව, මොණරාගල හා මුලතිවු දිස්ත්‍රික්කවල තෝරා ගත් ග්‍රාම නිලධාරි වසම් ගණනාවක විද්‍යුත් පුරවැසි වාර්තා පත් (eCRC) සමීක්ෂණ පැවැත්වීමේ කාර්යයට මුල පිරුවේ ය. විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණවල අභිමතාර්ථය වූයේ අධ්‍යයන ප්‍රදේශය තුළ

(i) ද්විතීය අධ්‍යාපන සේවා සම්පාදනය
(ii) ප්‍රාදේශීය සභා රාජ්‍ය සේවා සම්පාදනය

යන ක්ෂේත්‍ර දෙකට අදාළව සේවාවන්හි ගුණාත්මක බව, සේවා සම්පාදකයන්ගේ වග වීම හා වැඩි දියුණු කළ යුතු අංශ තීරණය කිරීම යි. මෙම වාර්තාව සමාජීය වග වීම හා විනිවිද භාවය සාක්ෂාත් කර ගැනීමේ මෙවලමක් ලෙස විද්‍යුත් පුරවැසි වාර්තා පත යොදා ගැනීමේ අරමුණ ඇතිව පවත්වන ලද ප්‍රථම විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ සොයා ගැනීම් ඉදිරිපත් කරයි. දිස්ත්‍රික්ක තුන තුළ සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම සඳහා වහා ම අවධානය යොමු කළ යුතු හා පියවර ගත යුතු යැයි ප්‍රතිචාර දැක්වූවන් විසින් හඳුනා ගන්නා ලද අංශ ගණනාවක් විද්‍යුත් පුරවැසි වාර්තා පත් සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් අනාවරණය විය. විද්‍යුත් පුරවැසි වාර්තා සමීක්ෂණයේ ප්‍රාරම්භක සොයා ගැනීම් පදනම් කර ගෙන ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කෙරුණු අතර සේවා සම්පාදකයන් හා සේවාලාභීන් අතර සාකච්ඡා සඳහා පහසුකම් සපයනු ලැබිණ. මෙම වාර්තාව සම්පාදනය කර ඇත්තේ මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් ප්‍රචලිත කිරීම පිණිස සහ අවශ්‍ය තැන්වල දී මෙහෙයුම් ප්‍රතිපත්ති වෙනුවෙන් අභිදේශනයේ යෙදීම හා ප්‍රතිසංස්කරණ පියවරයන් ගැනීම පිණිස මෙම තොරතුරු යොදා ගැනීම සඳහා ය.




29, ආර්. ජී. සේනානායක මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුර : +94 11 46902200, 2676955
ෆැක්ස් :+94 11 2676959
විද්‍යුත් තැපෑල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk


centre for poverty analysis

European Union

ACTED

ISBN: 978-955-3628-34-3